

අධ්‍යයන ගොනුව
stages
theatre
group
Directed by JAYAMPATHI GURUGE
WALKING PATH
வோகின் பாத்
වෝකින්ග් පාත්
a play without words, devised along the walking paths of Colombo

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයෙන් තොරව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් නැවත සකස් කිරීම හෝ වෙනත් පිටකවරයකින් පළ කිරීම හෝ ප්‍රකාශයට පත් කර ඇති තත්වයෙන් හෝ තත්වයට වඩා වෙනස් ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීම හෝ සපුරා තහනම්.

**අධ්‍යයන ගොනුව**
**Walking Path - වචන නැති නාට්‍යයක්**

පළමු ප්‍රකාශනය (අන්තර්ජාල/ e - ප්‍රකාශන) 2020
© 2020 ස්ටේජස් නාට්‍ය කණ්ඩායම
ISBN 978-624-5487-33-2

# WALKING PATH

## வோகின் பாத் වෝකින්ග් පාත්

**වචන නැති නාට්‍යයක්** - devised along the many pristine walking paths of the city of Colombo


**රචනය :** රුවන්තී ද චිකේරා

**අධ්‍යක්ෂණය :** ජයම්පති ගුරුගේ



**ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ නිෂ්පාදනයක්**

පළමු දර්ශනය 2014 ජූලි

ලයනල් වෙන්ඩ්ට් රඟහල

කොළඹ - ශ්‍රී ලංකා


**වෝකින්ග් පාත්**

**වචන නැති නාට්‍යයක් - අධ්‍යයන සම්පත් ගොනුව**

**"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්"** යනු ශ්‍රි ලංකාව තුළ වසර 30 කට වැඩි කාලයක් පුරා පැවති  සිවිල් යුද්ධයෙන් පසුව රට තුළ සිදු වූ දේශපාලනික, සාමාජීය හා සංස්කෘතික වෙනස්වීම් ඇසුරෙන් ඩිවයිසින් රංග ක්‍රමවේදය යොදාගනිමින් නිර්මාණය කරන ලද ශ්‍රී ලංකාවේ පළමු සංවාද නොමැති නාට්‍ය නිර්මාණයයි.

නගර අලංකරණය, මිලිටරීකරණය සහ සංස්කෘතික වාරණය පිළිබදව මෙම නාට්‍ය නිර්මාණය තුලින් සාකච්ජා කිරීමට උත්සහ දරයි. පශ්චාත් යුද කාලයේ මුල්ම වකවානුව තුළ රටේ අගනුවර වන කොළඹ සහ තවත් ප්‍රධාන නගර වටා ඉදිවෙමින් පැවති **"වෝකින්ග් පාත්"** නැමැති රටේ පුරවැසියන්ට ශාරීරික ව්‍යායාම්වල යෙදීමට සහ නිදහසේ කාලය ගතකිරීම වෙනුවෙන් වෙන් වූ භූමි ප්‍රදේශයන්වල ගොඩනැගෙමින් පැවති උප සංස්කෘතිය සහ මිනිස් ප්‍රජාවගේ හැසිරීම් අධ්‍යයනය කළ කලාකරුවන් පිරිසක් විසින් මෙම නිර්මාණය ගොඩනගන ලදි.

2015 වසරේ ඉන්දියාවේ මුම්බායිහි පැවති අන්තර්ජාතික තරුණ නාට්‍යකරුවන් (වයස 25ට අඩු) වෙනුවෙන් පවත්වන තේස්පො - 16 (Thespo 16) නියෝජනය කරමින් හොඳම අධ්‍යක්ෂණය, හොඳම නාට්‍යය ඇතුලු ප්‍රධාන සම්මාන කිහිපයක් **"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්"** හට  හිමිකර ගැනීමට හැකියාව උදා විය

මෙම අධ්‍යයන ගොනුව රචනා කරන්නේ
"වෝකින්ග් පාත්" නාට්‍යය  නිර්මාණය සිදුකර වසර හයකට පසුවයි.

# පටුන

## 01

"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක් " අධ්‍යයන ගොනුව.

## 02

වෝකින්ග් පාත් පිළිබඳව වචන නැති නාට්‍යයක් බිහිවීමට ඇතිවූ පෙළඹවීම.

- ස්වයං පෙළඹවීම
- රාජ්‍ය වාරණය සහ ස්වයං වාරණය
- නගර වෙනස්වීම සහ මිනිසුන්ගේ නිහඬ බව

## 03

"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක් " නිර්මාණ ක්‍රියාවලියේ ආරම්භය, අධ්‍යයනය සහ තොරතුරු රැස් කිරීම.

- පළමු අදියර - ජීවිතයේ වචන නැති මොහොතක් සොයා
- දෙවන අදියර - සංකල්පය දිගහැරීම
- තෙවන අදියර - ඇවිදින මංතිරු අධ්‍යයනය
  - ඇවිදින මංතීරුවල මිනිස් චර්යාවන් අධ්‍යයනය සහ සටහන් තබා ගැනීම
    - සුඛෝපභෝගි වාහන සහ ත්‍රිවීල්
    - තරබාරු ශරීර සහ කෙසඟ ශරීර
    - මහත ඇමතිවරු සහ ආරක්ෂකයෝ
    - විනීත පෙම්වතුන් සහ විසිල් ගසන මුරකරුවන්
    - තරුණ දෙමාපියන් සහ දරුවන්
    - Zumba Dance සහ නැටුම්
    - විලාසිතානු යෝගා සහ යෝගා
    - සිවිල් හමුදාව
    - නිදහස සහ පොලීසිය
    - දුවන විලාසිතා
    - සෙල්ෆි සහ ඇවිදින හෙඩ් සෙට්
    - හුදකලාවන මිනිසුන්
    - තහනම් වෙළෙන්දන්
    - තහනම් බෝඩ්
  - ඇවිදින මංතීරු තුළ ගොඩනගාගත් සංවාද එකතුවක්

# 04

**"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" අංක දහ හතකින් සමන්විත රංගයක් බවට පත්වීම**

- චරිත ගොඩ නැගීම
- රංගවින්‍යාසගත කිරීම
- "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යක්" නිර්මාණයේහි ඩිවයිසින් ක්‍රියාවලිය, පුහුණුවීම් ක්‍රියාවලිය සහ අංක දහහතකින් යුත් රංගය ගොඩනැගුනු ආකාරය.

- SCENE 1 - නරක කාලය අවසන්! නව යුගයක උදාව!
- SCENE 2 – නිදහස් අවකාශ විවෘත සම්බන්ධතා
- SCENE 3 - සිංහ රුවක ඝර්ජනාව
- SCENE 4 - අවසන් අංශුව දක්වා
- SCENE 5 - කුරුල්ලන්ගෙන් පරිස්සම් වන්න
- SCENE 6 - ඒ මම නෙවෙයි
- SCENE 7 – "ජිං ජිං තාරා" මා පාලනය වන දුරකතන...
- SCENE 8 - මතකය පැරණි විලාසිතාවකි
- SCENE 9 - SELFISH සමාජයක SELFIEයක්...
- SCENE 10 - නගරයේ ලිංගිකත්වය
- SCENE 11 - බැටරි ළදරුවන්
- SCENE 12 - ඒ සියලු ඝෝෂාවෙන් පසු..
- SCENE 13 - මගේ දුරකථනයේ ලෝකය
- SCENE 14 - ධාවන පථයෙහි අඩි සලකුණු
- SCENE 15 - "යමක් " තහනම්
- SCENE 16 - සාමුහිකව තනිවම
- SCENE 17 - මෝඩ තීරණ ගන්න එපා...

# 05

**"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" මංගල දර්ශනය සහ වෙනසක්**

- වාරණය හමුවේ ප්‍රසිද්ධ රැගුම් පාලක අවසරය ලබා ගැනීම.
- මංගල දර්ශනය සහ වෙනසක් බලාපොරොත්තු වන සමාජයක්

# 06

**"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" නිර්මාණය සමඟ එකතු වූ පිරිස සාමුහිකව**

# 01

## “වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්”

අධ්‍යයන ගොනුව



# හැඳින්වීම

මෙම අධ්‍යයන ගොනුව තුළින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" නාට්‍යයට පසුබිම් වූ පශ්චාත් යුද කාලය (2009 - 2014 දක්වා) තුළ ශ්‍රී ලංකාවේ පැවති දේශපාලනික වාතාවරණය හේතුවෙන් ගොඩනැගුනු නගර අලංකරණය, මිලිටරීකරණය සහ සංස්කෘතික වාරණය පිළිබඳව, මේ නාට්‍ය නිර්මාණ ක්‍රියාවලියේදී නාට්‍ය කණ්ඩායම ලද අත්දැකීම් සහ මුහුණ දුන් අභියෝග සම්බන්ධවයි.

# වෝකින්ග් පාත්
## නොහොත් ඇවිදින මංතීරු

**ශ්‍රී ලංකාව තුළ දශක කිහිපයක් පුරාවට පැවති සිවිල් යුද්ධය නිමා වූ වහාම** නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නගර අලංකරණය නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. ඒ අනුව, කොළඹ නගරය අශ්‍රිතව නිදහස් චතුරස්‍රය පරිශ්‍රය | විහාර මහා දේවි උද්‍යානය | දියත උයන | දියවන්නා වෝකින්ග් පාත් | Urban Wetland Park (නුගේගොඩ) ආදි ස්ථාන ජනතාවට ඇවිදීමට, ශාරීරික ව්‍යායාම් කිරීමට හෝ නිදහසේ කාලය ගතකිරීම සුදුසු ස්ථාන බවට පත්විය.

- ඇයි මෙම ස්ථාන නිර්මාණය කරලා තියෙන්නේ?
- කවුරු වෙනුවෙන්ද මෙම ස්ථාන නිර්මාණය කරන්නේ?
- මෙම ස්ථානවල සිටින මිනිස්සු කවුද?
- ඇයි මිනිස්සු දුවන්නේ?
- මෙම ස්ථානවලට පැමිණෙන මිනිස්සු දෙස බලාගෙන සිටින මිනිස්සු කවුද?
- ඇයි මෙම ස්ථාන මෙතරම් නිශ්ශබ්ද?
- කාටද බය?
- මොනවද මෙම ස්ථානවල කරන්න පුළුවන්?
- මොනවද මෙම ස්ථානවල කරන්න බැරි?
- ඇයි මෙම ස්ථාන මෙච්චර පිරිසිදු?
- මෙම ස්ථානවල ජංගම දුරකථන සමඟ මිනිසුන්ගේ ඇති සම්බන්ධය
- මෙම ස්ථානවල මිනිස්සු හුදකලා ඇයි?
- මෙම ස්ථානවල  මිනිස් සම්බන්ධතා මොනවගේද ?

# 02

## වෝකින්ග් පාත් පිළිබඳව

## වචන නැති නාට්‍යයක් බිහිවීමට ඇතිවූ පෙළඹවීම



**මෙම පරිච්ඡේදය තුළදී සාකච්ඡා කිරීමට  බලපොරොත්තු වන්නේ** ඇවිදින මංතිරු සම්බන්ධව වචන නැති නාට්‍යයක් කිරීම සඳහා බලපෑ ප්‍රධාන කාරණා කිහි-පයක් සම්බන්ධවයි. මෙහි නාට්‍යයේ අධ්‍යක්ෂවරයා වන ජයම්පති ගුරුගේ හට වචන නැති නාට්‍යයක් නිර්මාණය කිරීමට තිබූ කැමැත්ත, පශ්චාත් යුද සමයේ ආරම්භයේදී රට තුළ පැවති රාජ්‍ය වාරණය සහ ස්වයං වාරණයේ ස්වභාවය සහ කොළඹ නගරයේ ස්වභාවය වේගයෙන් වෙනස් වීම සම්බන්ධයෙන් ඇති සමාජයේ නිහඬ පිළිබඳව නිර්මාණයක් කිරීමට නාට්‍යය රචනා කළ රුවන්ති ද චිකේරා හට තබූ අවශ්‍යතාවය සම්බන්ධව සඳහන් වේ.

# ස්වයං පෙළඹවීම

ජයම්පති ගුරුගේ කොළඹ සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන කාලය (2009 - 2014) තුළදී Physical Theater "Dance Theater", Nonverbal Theatre", Contemporary Theatre "Contemporary Dance" ආදි විවිධ රංග කලා ප්‍රභේද පිළිබඳව කළ අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වචන නැති කෙටි නාට්‍ය ත්‍රිත්වයක් නිර්මාණය කරනු ලැබීය. එහිදී වචන අතික්‍රමණය කරමින් ශරීරය ප්‍රධාන ප්‍රකාශන මාධ්‍ය ලෙස භාවිතා කිරීමට හැකි ද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමට ඔහුගේ වැඩි කැමැත්තක් යොමු වීය.

විශ්වවිද්‍යාලයේ පළමු වසර තුළ ඔහු විසින් නිෂ්පාදනය කරනු ලැබූ **"පුටු 11ක්"** නිර්මාණය තුළදී, පුද්ගලයෙක් තමන්ගේ ස්වාත්මය සමඟ පවතින අරගලය සහ එම අරගලය යටපත් කිරීමට දරන උත්සහය පිළිබදව සාකච්ඡා කරයි.

විශ්වවිද්‍යාලයේ තෙවන වසර තුළදී ජයම්පති විසින් නිෂ්පාදනය කරනු ලැබූ **"ෆ්‍රේම්ස්"**, චිත්‍ර ශිල්පියෙකු සමාජය අත්දකින ආකාරය සහ ඔහු එම අත්දැකීම් තමන්ගේ නිර්මාණ තුළට ගොනු කරගැනිම සිදු කරගන්නේ කෙසේද යන්න පිළිබඳව විල්සන් වැංගො චිත්‍ර ශිල්පියාගේ ජීවිතය පාදක කොට ගනිමින් නිර්මාණය කිරීමට ගත් උත්සහයක් ලෙස දැක්විය හැක.

විශ්වවිද්‍යාලයේ අවසාන වසර තුළ ජයම්පති විසින් නිර්මාණය කරනු ලැබූ **"මුජරී"** හරහා සාකච්ඡා කරන්නේ එවකට (2013 වර්ෂය අගභාගය) පොදු සමාජය තුළ මෙන්ම විශ්වවිද්‍යාල තුළද පැවති මිනිස් පැවත්මෙහි ඒකාකාරීභාවය, මිනිසුන් තමන් තුළම වු පීඩනයෙන් මිරිකී කිසිවක් කරකියා ගත නොහැකිව සිටින ආකාරය, ප්‍රශ්න කිරීමකින් තොරව කවරෙකු හෝ පසුපස යන ස්වභාවය සහ මිනිසුන් තමන්වම ස්වයං වාරණයට සහ පාලනයට ලක්කරගනිමින් සිටින ආකාරය පිළිබදවයි.

# රාජ්‍ය වාරණය සහ ස්වයං වාරණය

යුද්ධය පවතින කාලය තුළදී සහ පශ්චාත් යුදකාලයේ ආරම්භයත් සමඟ (2009 - 2014) ශ්‍රී ලාංකිය සමාජ පසුබිම තුළ රාජ්‍ය වාරණය සහ ස්වයං වාරණය දැඩිව පැවතුන අතර ඒ පිළිබඳව ජයම්පති ගුරුගේ එම වකවානුවේ ලියා තිබු සටහනක්.

"යුද්ධය පවතින කාලය තුළදී සහ යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව තුළ පුද්ගලයින්ගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රකාශන අයිතිය විවිධ අයුරින් මර්දනය කිරීමක් ආරම්භ වනවා දැකගන්න ලැබුණා. ඒ වගේම නිදහස් අදහස් ප්‍රකාශකරන්නන්, කලාකරුවන්, සිවිල් ක්‍රියාකාරීන් සහ මාධ්‍යවේදීන් අතුරුදහන් කිරීම්, පැහැර ගැනීම් සහ ඔවුන්ට තර්ජන සිදු කළ අවස්ථා පිළිබඳව විවිධ අවස්ථාවන් තුළදි දැනගැනිමට හැකියාව ලැබුණා. නීතිය පිළිබඳව විශ්වාසය හීන වෙලා ගියා. සමාජයයේ බහුතර මතය, තමන්ගේ ප්‍රමාණය දැන ක්‍රියා කිරීම බව සමජගත විමක් දැක ගන්න පුලුවන් වුණා. රට තුළ මට කළ හැකි දේ කුමක්ද? මට කළ නොහැකි දේ කුමක්ද ? මම දන්නේ නෑ මට රට තුළ හැසිරෙන්න පුලුවන් සීමාව. මම දුටුවා ප්‍රවේසම්කාරී ජීවිතයක් අපේක්ෂා කරන බහුතර ජනතාවක්. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් පවතින ක්‍රමයට එකඟ කරවා ගැනීමට මහන්සි වන පිරිස්. පිඩාවට පත්වන සුළු ජාතින්. මිත්‍යාව වපුරන මිනිසුන්. මුදල් පසුපස දුවන සමාජ පංති. බලය හමුවේ ආත්ම ගෞරවය පාවා දෙන මාධ්‍ය ආයතන. නිහඬ වෙන බුද්ධිමතුන්. ක්‍රමක්‍රමයෙන් මිලිටරිකරණය වන සමාජයක්.

**මගේ අප්පච්චී දවසක් දුරකථනය ඇමතුමක් අරගෙන මට කතා කරලා කිවුවා.**
**පොඩි පුතා ඔයාට මේ පවතින විදිහ තනියම වෙනස් කරන්න බෑ. මට දැන් 69යි. අපි දන්න කාලේ ඉඳලා මේ රටේ දේශපාලනය හැසිරුනේ මෙහෙම තමයි. ඔයාලා තරුණ නිසා ආවේගෙන් දේවල් කරන්න යන්න එපා. ඔයාට මොනවා හරි වුනොත් ඔයා වටේ ඉන්න කවුරුත් නෑ. කවුරුත් හිටියා කියලා වැඩකුත් නෑ. මම ඔයාට කිසිම දෙයක් කරන්න එපා කියන්නේ නෑ. හැබැයි මේක තමයි මේ රටේ මෙච්චර කල් පැවතුන විදිහ.**

මම ඉතාම පොඩි මනුස්සයෙක්. හැබැයි අපේ ගෙදර අය මං ගැන බය වෙලා තිබුණා. තමන්ගේ ළඟම ඉන්න කෙනා ආරක්ෂා කරගන්න බහුතරය වගබලාගත්තා. සමාජය දිහා බැලුවත්, ළඟම ඉන්න කෙනෙකු දිහා බැලුවත් පෙනෙන්න තිබුණේ ස්වයංව වාරණය කරගන්නා හෝ ස්වයංව වාරණය කරගැනීමට පොළඹවන පරිසරයක්. වෙනසක් අපේක්ෂා කරන සුළුතරය අතර සිටීම පැවැත්මට තර්ජනයක් බව හොඳින්ම තේරුම් ගන්න පුලුවන් කාල වකවානුවක්. සමකාලින කලාකරුවන් මෙම අරගලය තුළ හැකි උපරිමය තමන්ගේ කලා කටයුතු පවත්වාගෙන යාම හෝ ඒ තුළ කතා කරනු ලබන පවතින දේශපාලනික යථාර්ථය පෙන්වීමට දරන උත්සහය දැකගන්න පුලුවන් වුනා. එවැනි පසුබිමක මට මොකක්ද ඇත්තටම කරන්න ඕන? කියන අරගලයේ මම කාලයක් සිටියා. එම අරගලය නිර්මාණයක් තුළට ගොනුකර ගැනීමට  හැකිවේදැයි නිරන්තරයෙන් මා හට පෙළඹවීමක් ඇතිකලා.

- ජයම්පති ගුරුගේ "

# නගර වෙනස්වීම සහ මිනිසුන්ගේ නිහඬ බව

**යුද්ධයට පසු** ශ්‍රී ලංකාව තුළ රජයේ මැදිහත්වීමෙන් නගර අලංකරණ ව්‍යපෘතියක් ක්‍රියාත්මක විය. මෙම ව්‍යපෘතිය යටතේ නගර අලංකරණය මෙන්ම නගර වෙනස්වීම ද ඉතා සීඝ්‍රයෙන් සිදු වූ අතර ඒ හා සමගාමීව අලුතින් ඉදිවන ස්ථානයන්ට අදාළව විවිධ උප සංස්කෘතීන් බිහිවීමක් දැකගත හැකි විය. මේ සිදුවන වෙනස්කම් සමාජයක් ලෙස භාර ගන්නේද? නොගන්නේද? මේ වෙනස්කම්වලට සමාජයක් ලෙස එකඟද? නැද්ද? යන්න පිළිබඳ කතිකාවක් සමාජයේ දැකගන්නට නොවීය. මුළු සමාජයම ඒ දෙස නිහඬව බලා සිටීම පමණක් සිදුකරනු දැකගන්න හැකි විය. මෙසේ ගොඩනැගෙමින් පවතින නව සමාජ පද්ධතිය සහ එහි ස්වභාවය කුමන අරමුණක් කරා ඉදිරියට ඇදෙනවාද යන්න පිළිබඳව රුවන්ති ද චිකේරාගේ මෙන්ම ස්ටේජස් නාට්‍යය කණ්ඩායමේ අවධානය යොමු විය. ඒ වගේම රට තුළ පවතින ගැඹුරු නිහඬ බව පිළිබඳවද සාකච්ඡාවක් ද ඇරඹීය. එම සාකච්ඡාවන් තුළ අවධානය යොමු වූ කරුණු කිහිපයකි.

- නගර පිරිසිදු කිරීම.
- පරණ ගොඩනැගිලි නවීකරණය කිරීම
- හිඟන්නන් ඉවත් කිරීම
- විදී සුනඛයන් ඉවත් කිරීම
- කොළඹ නගරය ආශ්‍රිත වතුවල (මුඩුක්කු) ජීවත් වන මිනිසුන් ඉවත් කිරීම
- සංස්කෘතිය කෘතීම ව වෙනස් කිරීම
- විදේශිකයන් සහ ඉහල මධ්‍යම පංතිය උදෙසා ස්ථාන නිර්මාණය කිරීම
- විදේශ ආයෝජන සඳහා රටේ භූමිය වෙනත් රටවල් වෙත පවරා දීම
- මාර්ග සහ නගර අලංකරණය.
- නගර ආශ්‍රිතව ඉදි වන කෘතීම ළමා උද්‍යාන සහ ශරීර සුවතා සඳහා ඇවිදින මංතීරු බිහි වීම

මෙලෙස තත්කාලින සමාජය තුළ පවතින ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කිරීම තුළින් නාට්‍ය නිර්මාණයක් ලෙස තම ප්‍රකාශනය සමාජගත කිරීම **"ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ"** උවමනාව විය. එම නිසා ඇවිදින මංතීරු ආශ්‍රිතව ගොඩනැගෙන උප සංස්කෘතිය පාදක කරගෙන වචන නොමැති නාට්‍ය නිර්මාණයක් කිරීමට සාකච්ඡා සිදුවිය. ඒ සමඟම එම නිර්මාණය ආරම්භ කිරීමට යාමේදි ඇතිවිය හැකි යැයි උපකල්පනය කළ ප්‍රධාන ප්‍රශ්න කිහිපයකි.

- වචන නැති නාට්‍යයක් පිළිබඳව ශ්‍රී ලංකාවේ ප්‍රේක්ෂකයින්ගේ ප්‍රතිචාරය කුමක් විය හැකිද?
- පවතින රජයේ මුලික වැඩ පිලිවෙලක් වශයෙන් ක්‍රියාත්මක වන නගර අලංකරණය සහ ඊට සමගාමිව වෙනස් වන උප සංස්කෘතින් තේමා කරගනිමින් නිර්මාණයක් කිරීම සම්බන්ධව ගැටලු ඇතිවිය හැකිද?
- කොහොමද මේ තේමාව වචන නොමැතිව ගොඩනගන්නේ?
- ඩිවයිසින් ක්‍රමවේදය මුලික කරගනිමින් මෙම නිර්මාණය ගොඩනැගීමට හැකි වේද?

කෙසේ වෙතත් අවසානයේ ජයම්පතිගේ අදහස අනුව රටේ පැවති රාජ්‍ය වාරණය, ස්වයං වාරණය - මිලිටරිකරණය හමුවේ මිනිසුන් තුළ වචනවලට ඇති බලය හීන වී ගොස් නිහඬව කිසිවක් නොකර බලා සිටීම හේතුවෙන් වචන නැති නාට්‍ය නිර්මාණයක් කිරීමේ අවශ්‍යතාවය සහ රුවන්තීගේ අදහස අනුව යුද්ධයට පසු සීඝ්‍රයෙන් වෙනස් වන ශ්‍රී ලංකාව මෙන්ම අලුතින් ගොඩනැගෙන උප සංස්කෘතීන් පිළිබඳව නිර්මාණයක් කිරීමේ අවශ්‍යතාවය මත "වෝකින්ග් පාත්" නොහොත් ඇවිදින මංතීරු පිළිබඳව වචන නැති නාට්‍යයක් නිර්මාණය කිරීමට ස්ටේජස් නාට්‍යය කණ්ඩායම විසින් තීරණය කරන ලදී.



# 03

## “වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්”

## නිර්මාණ ක්‍රියාවලියේ ආරම්භය, අධ්‍යයනය සහ තොරතුරු රැස් කිරීම...

# පළමු අදියර ජීවිතයේ වචන නැති මොහොතක් සොයා

මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යක්" නිර්මාණය ක්‍රියාවලියේ ආරම්භය, අධ්‍යයනය සහ තොරතුරු රැස්කිරීම සිදුකළ ආකාරය සම්බන්ධවයි. තවද, එම ක්‍රියාවලිය තුළදී නාට්‍යය කණ්ඩායම ලද අත්දැකීම් ක්‍රමානුකූල ව පෙළගැස්වීමක් සිදු කෙරේ.
පළමු අදියර වශයෙන් මිනිසුන් වචන භාවිතා නොකරන මොහොතක සිදුවන මිනිස් හැසිරීම් සහ ශරීර භාවිතාව හඳුනා ගැනීමට, රූපණ ශිල්පින් පුහුණු කිරීම සිදුකළ ආකාරය පිළිබඳවද, දෙවන අදියර වශයෙන් ඇවිදින මංතීරු තුළ සිදුවිය හැකි සිදුවීම් සහ මිනිස් සම්බන්ධතා වචන නොමැතිව ගොඩනැගීම සිදුකළ අයුරු ද, තෙවන අදියර වශයෙන් කණ්ඩායම විසින් ගත් තීරණයකට අනුව කොළඹ නගරය වටා ඉදිවෙමින් පැවති ඇවිදින මං තීරු වෙත ගොස් අධ්‍යයනය සහ සටහන් තබා ගැනීම සිදුකළ අයුරු පිළිබඳවද මෙහි දී සාකච්ඡා කෙරේ.

වචන නැති නාට්‍යයක් නිර්මාණය කිරීමට යාමේදි රූපණ ශිල්පින් තෝරාගැනිම සම්බන්ධව දින හතක වැඩමුළුවක් පැවත්විය. එහිදී රූපණ ශිල්පීන් වශයෙන් ප්‍රධාන ඩිවයිසින් කණ්ඩායම (main devising team) හත්දෙනෙකුගෙන් සමන්විත විය. (එම කණ්ඩායමේ බහුතරයක් මින් පෙර ඩිවයිසින් ක්‍රමවේදයට අනුව නිර්මාණය කරනු ලබන නාට්‍ය ක්‍රියාවලියකට හා වචන නැති නාට්‍යය නිර්මාණයකට සම්බන්ධ වී නොතිබුණු බවත් සඳහන් කළ යුතුයි.)

වැඩමුළුවේ පළමු දින කිහිපය තුළදී කණ්ඩායම විසින් වචන භාවිතා නොකරන විවිධ අවස්ථාවන් ගොඩනැගීමේ ක්ෂණික නිරූපණ (Improvisation) ක්‍රියාවලියක නිරත විය. මෙහිදී මුලිකව ම මිනිස් සම්බන්ධතා පිළිබඳව ක්ෂණික නිරූපණ තුළින් අවස්ථා ගොඩනැගීම සිදු කරනු ලදී. එහිදි අභිරූපණ (Miming) ආකෘතියට අනුගත නොවී සාමාන්‍ය ජීවිතයේදි වචන භාවිතා නොකර සිටින අවස්ථා ගොඩනැගීම පිළිබඳව කණ්ඩායමේ අවධානය යොමු විය. මෙහි අරමුණ විශේෂයෙන්ම සියුම් චලන, හැඟීම් හා සම්බන්ධතා තුළින් යම්කිසි අදහසක් ගොඩනැගිමට ඇති හැකියාව පිරික්සීමයි. ඇතැම් අවස්ථාවලදී වචන මත පදනම් ව ඇතැම් සිදුවීම් ගොඩනැගීම සිදු කර පසුව ක්‍රමක්‍රමයෙන් එහි ඇති වචන ඉවත් කරමින් වචන නොමැති මොහොතක් දක්වා එම අවස්ථා සංවර්ධනය කරන ලදි.

# දෙවන අදියර

# සංකල්පය දිගහැරීම

ඇවිදින මංතීරු පිළිබඳව සංකල්පය කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීමත් සමඟ ඇවිදින මංතීරු සම්බන්ධව කණ්ඩායමේ සාමාජිකයින් දන්නා දේ සහ දැක ඇති කරුණු මුල් කරගනිමින් ක්ෂණික නිරූපණ ක්‍රියාවලිය ආරම්භ කිරීම සිදු කරනු ලැබිය. එහිදී විවිධ තේමාවන් ඔස්සේ ක්ෂණික නිරූපණ ක්‍රියාවලිය සිදුකළ අතර විශේෂයෙන් ඇවිදින මංතීරු තුළ දැකිය හැකි උප සංස්කෘතිය සහ එතුළ වූ මිනිස් සම්බන්ධතා පිළිබඳ ව කණ්ඩායමේ මූලික අවධානයක් යොමු විය.

- පෙම්වතුන්
- දරුවන් සහ දෙමාපියන්
- සමලිංගික සම්බන්ධතා
- අනියම් සම්බන්ධතා
- ඇවිදින මංතීරු නඩත්තු කරන පිරිස
- හමුදාව සහ මිනිසුන් අතර පවතින සම්බන්ධය
- මිනිසුන් පාලනය වන ආකරය

ආදී විවිධ තේමාවන් යටතේ ක්ෂණික නිරූපණ ක්‍රියාවලීන් ගොඩනැඟීය.

පළමු සතිය අවසාන වන විට කණ්ඩායමේ සාමාජිකයින් හට ඇවිදින මංතීරු සම්බන්ධව ඇති දැනුම සහ එම සංස්කෘතිය පිළිබඳව අත්දැකිම ප්‍රමාණවත් නොවන බව කණ්ඩායම වටහාගන්නා ලදී. කණ්ඩායමේ සාමාජිකයින් විසින් ක්ෂණික නිරූපණ තුළින් ගොඩානගා තිබු බහුතරයක් නිරූපණයන් සාමාන්‍ය ජිවිතයේ සිදුවිය හැකි සිදුවීම් ඇවිදින මංතීරු තුළද සිදුවිය හැකි යැයි උපකල්පනය මත සිට ගොඩනැගූ නිරූපණයන් විය. විශේෂයෙන්ම කණ්ඩායම තුළ සිටි බහුතර පිරිස මෙම ඇවිදින මංතීරු තුළ ගොඩනැගෙමින් පවතින උප සංස්කෘතිය වැලඳ ගෙන සිටි පිරිසක් හෝ ඒවැනි ස්ථාන තුළ නිතර ගැවසෙන පිරිසක් නොවිම මීට හේතු විය හැක.

මේ හේතුවන් කණ්ඩායමේ සාමාජිකයින් සියලු දෙනා කොළඹ වටා අලුතින් ඉදි කරන ලද ඇවිදින මංතීරු වෙත ගොස් ඒ පිළිබඳව හොඳින් අධ්‍යයනය කිරීම වැදගත් බව තීරණය විය.

# තෙවන අදියර
# ඇවිදින මංතිරු අධ්‍යයනය

- නිදහස් චතුරස්‍රය පරිශ්‍රය
- විහාරමහාදේවී උද්‍යානය
- දියවන්නා වෝකින්ග් පාත්
- URBAN WETLAND PARK (නුගේගොඩ)

කණ්ඩායමේ සාමාජිකයින් උදෑසන කාලයේ සහ සවස් කාලය තුළදී කොළඹ අවට ඉදිකර තිබූ ඇවිදින මංතීරු වෙත ගොස් එහි ගැවසෙන මිනිසුන්ගේ චර්යාවන් වඩාත් තියුණු ව ග්‍රහණය කරගැනීම ආරම්භ කරන ලදී. එම ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත විය.

- ඇවිදින මංතීරු තුළ වූ මිනිස් චර්යාවන් අධ්‍යයනය සහ සටහන් තබා ගැනීම.
- මුරකරුවන්, හමුදා සෙබලුන් සහ මිනිසුන් සමඟ සංවාද ගොඩනගා ගැනීම.

ඇවිදින මංතීරු තුළ වූ

# මිනිස් චර්යාවන් අධ්‍යයනය සහ සටහන් තබා ගැනීම

කණ්ඩායමේ සාමාජිකයින් විසින් ඇවිදින මංතීරු සහිත පරිශ්‍රයන්හී අධ්‍යයන ක්‍රියාවලිය තුළදී නිරීක්ෂණය කළ විශේෂ චරිත සහ සිදුවීම් ලයිස්තු ගතකිරීමක් පහත සදහන් වේ.

## සුඛොපබෝගි වාහන සහ ත්‍රීවීලර් රථ

- ඉතාම මිල අධික සුඛොපබෝගි වාහන වලින් පැමිණෙන පුද්ගලයින්.
- යහපත් ආර්ථික ස්ථාවරයක් ඇති පුද්ගලයින්ට පමණක් පාවිච්චි කළ හැකි උසස් වර්ගයේ වාහනවලින් පැමිණෙන පුද්ගලයන්.(බහුතර පිරිසක්)
- ත්‍රීවීලර් රථ හෝ බයිසිකල්වලින් පැමිණෙන පුද්ගලයින් (සුලු පිරිසක්)

## තරබාරු ශරීර සහ ශරීර

- තරබාරු විවාහක වැඩිහිටියන් සහ ඔවුන් පසු පස දුවන කෙසඟ කුඩා ළමුන්
- ඉතාම අපහසුවෙන් දුවන හෝ ඇවිදින, ගැටවර වියේ පසුවන ඉතා තරබාරු ළමුන්
- ශරීර සුවතා අවසන් කර එම ස්ථාන අසලම ඇති සුපිරි අවන්හල් තුළට ඇදෙන තරබාරු ගැහැනුන් සහ පිරිමින්.
- තරබාරු මහලු අය සහ ඔහුගේ හෝ ඇයගේ (ආච්චි/සියා) සහයට වතුර බෝතලය, ටවල් එක, දුරකතනය රැගෙන පසු පසින් එන කෙසඟ සිරුරු සහිත සේවක සේවිකාවන්.

## මහත ඇමතිවරු සහ ආරක්ෂකයෝ

- ආරක්ෂකයන් පිරිවාරාගෙන පැමිණෙන මැති, ඇමතිවරු
- මැති, ඇමතිවරු හට ශරීර සුවතා කිරීම සඳහා සහය වන ආරක්ෂකයෝ

## විනීත පෙම්වතුන් සහ විසිල් ගසන මුරකරුවන්

- කුඩයක් යට හෝ යම්කිසි ආවරණයකට මුවා වී සිටින පෙම්වතුන්
- පෙම්වතුන් දෙස බලා සිටින මුරකරුවන්
- පෙම්වතුන් සිපගන්නා විට එය නැවැත්වීමට විසිල් ගසන මුරකරුවන්

## තරුණ දෙමාපියන් සහ දරුවන්

- අලුත්ම බයිසිකල්, රෝද සපත්තු, විවිධ මාදිලියේ සෙල්ලම් බඩු භාවිතා කරන ළමුන්
- දුරකථනය ඔබමින් සිටින හෝ දරුවන්ගේ ඡායාරූප ගන්නා දෙමාපියන්

## ZUMBA DANCE සහ නැටුම්

- ZUMBA DANCE මෙහෙයවන නිරෝගිමත් පෙනුමක් ඇති තරුණියන් සහ ඇයව අනුකරණය කිරීමට උත්සහ කරන ශරීරය රිද්මයකට අනුව සෙලවීමට හෝ පාලනය කරගත නොහැකි මැදිවිය ඉක්ම වූ ගැහැනු සහ පිරිමි

## විලාසිතානු යෝගා සහ යෝගා

- කුඩා කණ්ඩායම් වශයෙන් යෝගා කරනු ලබන පිරිස්
- තනි තනිවම ගසක් මුලට වී යෝගා කරන පුද්ගලයින්

## සිවිල් හමුදාව

- ට්‍රැක් බොටම්, ටී ෂර්ට්, කැන්වස් සපත්තු පැළඳ රාජකාරි කරන හමුදා සෙබලුන්
- කොස්සක්, ඉදලක්, කුණු ඉවත් කරන යමක් අතැතිව හෝ දිවා කාලයේ ගස්වල වසන කපුටන් එලවීම සඳහා කැටපොලයක් අතැතිව සිටින හමුදා සෙබලුන්
- ශාරීරික යෝග්‍යයතාවය පවත්වා ගැනිම සඳහා උදැසන කණ්ඩායම් වශයෙන් ශරීර සුවතා කරන හමුදා සෙබලුන්

### නිදහස සහ පොලීසිය

- නිදහසේ සිටින මිනිසුන් සහ පෙම්වතුන් අසලට ගොස් හැඳුනුම්පත් පරීක්ෂා කරන පොලීසිය

### දුවන විලාසිතා

- මිල අධික බ්‍රැන්ඩඩ් sports, running kit සහ බහුතරයක් ලුමිනෙස් (Luminex) වර්ණයන් එකින් එක ගලපා අඳින තරුණ තරුණියන්
- ශරීරයේ වැඩි ප්‍රදේශයක් නිරාවරණය වන අයුරින් විලාසිතා කරනපිරිස්.
- ඇවිදීමට අපහසු (දිග ලුංගි, දිග සායවල්, මුස්ලිම් හිජාබ් ආදී...) ඇදුම් ඇඳ ඇවිදින ගැහැණු
- කකුලට අපහසු සපත්තු පැලඳ දුවන ඇතැම් මිනිසුන්

### සෙල්ෆි සහ ඇවිදින හෙඩ් සෙට්

- කැමරාව සහිත දුරකතනයක් අතේ ඉහල කොටසේ රඳවාගෙන ඇවිදින හෝ දුවන මිනිසුන්
- තමන් විසින්ම තමන්ගේ ඡායාරූප ගන්නා පිරිස්
- ව්‍යායාම අතරතුර තමන්ගේ ඡායාරූප ගන්නා පිරිස්
- දුරකතනය දෙසම වැඩි වේලාවක් බලා සිටින පුද්ගලයින්
- හෙඩ් සෙට් (Headset) කනේ ගසාගෙන ඇවිදින හෝ දුවන මිනිසුන්

### හුදකලාවන මිනිසුන්

- තනි තනි ලෝක තුළ ජීවත් වන මිනිසුන්
- අසල සිටින පුද්ගලයින් ගැන වැඩි අවධානයක් නොමැති මිනිසුන්

### තහනම් වෙළෙන්දන්

- ඇවිදින මංතීරු මායිම්වලට වන්නට සිටින වෙළෙන්දන් (අච්චාරු/ බැලූන්/ කෙටි කෑම/කොල කැඳ ආදී...)

# තහනම් බෝඩ්

ඇවිදින මංතීරු තුළ "......තහනම්" ලෙස සඳහන් කර ඇති දැන්වීම් පුවරු බහුලව දැකගැනීමට  පුලුවන්.

තනකොළ පෑගීම තහනම්

දුම්බීම තහනම්

බිම ඉඳ ගැනීම තහනම්

බල්ලන් රැගෙන ඒම තහනම්

ඡායාරූප ගැනීම තහනම්

විනීතව හැසිරෙන්න

සිංහයා ඇල්ලීම තහනම්

ගස් ඇල්ලීම තහනම්

බයිසිකල් පැදීම තහනම්

බංකු මත කකුල් තැබීම තහනම්

නිකරුණේ ගැවසීම තහනම්

වෙළඳාම් කිරීම තහනම්

මෙම ස්ථානයේ ආහාර ගැනීම තහනම්

ශබ්ද කිරීම තහනම්

කුණු දැමීම තහනම්

# ඇවිදින මංතීරු තුළ ගොඩනගාගත් සංවාද එකතුවක්

පහත සඳහන් වන්නේ අධ්‍යයන ක්‍රියාවලිය තුළදී නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයන් අත්දුටු සත්‍ය සිදුවීම් කිහිපයක් සහ එම ස්ථානය තුළ සිටින මිනිසුන්, මුරකරුවන් සහ හමුදාවේ සාමාජිකයන් සමඟ ගොඩනැගුනු සංවාද කිහිපයකි.

## සිදුවීම් අංක 01 (විහාරමහාදේවි උද්‍යානය)

විහාරමහාදේවි උද්‍යානයේ සේවය කරනු ලබන මුරකරුවකුගේ අත්දැකීමක්.

දිනක් ඔහු රාජකාරි කරමින් සිටින විට සුඛෝපභෝගි වාහනයකින් පැමිණි පුද්ගලයෙක් වාහනය පාර අයිනේ නවතා, විහාරමහාදේවී උද්‍යානයට තණකොළ ඇති ප්‍රදේශය හරහා ඇතුල් විය. එවිට මෙම මුරකරු සමඟ රාජකාරියේ සිටි තවත් මුරකරු මහතෙක් මෙම වාහනයෙන් පැමිණි පුද්ගලයා සමඟ ඇතිවන සංවාදයක්.

**මුරකරු : මෙහෙන් තණකොළ පාගගෙන යන්න බෑ**

**පුද්ගලයා : ඇයි?**

**මුරකරු : පෙන්නේ නැද්ද මේවා හිටවලා තියෙන්නේ. මේක සිංගප්පූරුව වගේ කරන්න හදන්නේ.**

**පුද්ගලයා : ආ.. මම හිතුවේ මම ඉන්නේ ලංකාවෙ කියලා.**

එම පුද්ගලයා වෙන කිසිවක් නොකියා නැවත වාහනයට නැග පිටත්ව ගියේය.

අප සමඟ කතාකළ මුරකරු පැවසුවේ **"මට ඇත්තටම ලැජ්ජා හිතුනා මහත්තයා. මොනවා කරන්නද ඉතින්. අපි කරන්නේ අපිට කියල තියෙන රාජකාරියනේ."**

## සිදුවීම් අංක 02 (නිදහස් චතුරස්‍රය)

නිදහස් චතුරස්‍ර පරිශ්‍රය තුළ ඇති ගලින් සාදන ලද සිංහ රුවකට අත තබාගෙන කණ්ඩායමේ සාමාජිකයින් කිහිපදෙනෙක් කතා කරමින් සිටියි. ඒ අසලට පැමිණි මුරකරුවෙක්.

**මුරකරු : මේ ඕවා තියෙන්නේ අල්ලන්න නෙවෙයි. මේවා ජාතික උරුම.**

### සිදුවීම් අංක 03 (විහාරමහාදේවී උද්‍යානය)

විහාරමහාදේවි උද්‍යානය තුළ විසිල් ගසන හඬ නිතරම ඇසීමට හැකි ය.
ඒ පෙම්වතුන් සිපවැලඳ ගන්න අවස්ථාවන් මුරකරුවන් විසින් දුටු සැනින් මුරකරුවන් විසිල් කිරීම සිදුකරනු ලබයි.
ඒ පිළිබඳව මුරකරුවකුගේ අදහස්

**මුරකරු : විසිල් ගහලා පාලනය කරේ නැත්තන් මේ කෙල්ලො කොල්ලො රෙදි නැතුව මෙතන හැසිරෙන්නේ.**

**කණ්ඩායමේ සාමාජික : ඉතින් මේ අය තරුණ අයනේ.**

**මුරකරු : තරුණ අය කියලා කුණුහරුප කරන්න දෙන්න බෑ. සංස්කෘතියක් තියෙන්න ඕන.  අනික තව මිනිස්සු ඉන්නවා. පොඩි ළමයි ඉන්නවා. කොහොමත් දවල් දෙක වෙනකන් විතරයි කපල්වලට ඉන්න පුලුවන්.**

**කණ්ඩායමේ සාමාජිකඃ ඒ ඇයි?**

**මුරකරුඃ ළමයි සහ ෆැමිලිස් එනවා.**

**කණ්ඩායමේ සාමාජික : එහෙනම් තරුණ අයට විතරක් යන්න පුලුවන් තැන් හදන්න ඕන කියලා හිතෙන්නේ නැද්ද?**

**මුරකරු : ඒක ඇත්ත. එතකොට අපිටත් ලේසියි. එක පැත්තක් හදලා, තාප්ප ගහලා එතනට හොදට ආරක්ෂාව දාලා, ලයිට් ගොඩාක් දාන්න ඕන.**

### සිදුවීම් අංක 04 (විහාරමහාදේවී උද්‍යානය)

විහාරමහාදේවී උද්‍යානයේ නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයන් දෙදෙනෙක් සහ සාමාජිකාවක් සමඟ එම පරිශ්‍රය තුළ බිම ඉඳගෙන සාකච්ඡාවක සිටියි. පිරිමි එක් සාමාජිකයෙක් වතුර බිම සඳහා පිටත්ව යයි. මොහොතකින් විසිල් හඬක් ඇසේ.

**මුරකරු : කපල්වලට බිම ඉදගෙන ඉන්න බෑ.**

**කණ්ඩායමේ සාමාජික : අපි පෙම්වතුන් නෙවෙයි.  යාලුවො.**

**මුරකරු : අපි දන්නේ නැහැනේ.  ඒ උනාට ඔහොම බිම ඉදගෙන කතා කරන්න බෑ.**

**කණ්ඩායමේ සාමාජික : අපිත් එක්ක තව පිරිමි කෙනෙක් ඉන්නවා. අපි නාට්‍ය කරන කට්ටියක්. මෙතන කතා කර කර ඉන්නේ. (වතුර බිමට සාමාජිකයා නැවත පැමිණියා)**

**මුරකරු : එහෙම කතාකරන්න ඕනනම් වෙන තැනක් හොයාගන්න. මෙහේ බිම ඉඳගෙන ඉන්න බෑ.**

**කණ්ඩායමේ සාමාජික : ඒක පුදුම කතාවක් නේ. කවුද එහෙම කියන්නෙ?**

**මුරකරු : අපි කරන්නෙ රාජකාරිය. මොකක් හරි ප්‍රශ්නයක් තියනව නම් රාජ්‍ය ආරක්ෂක අමත්‍යංශයට ගිහින් කතා කරන්න.**

**කණ්ඩායමේ සාමාජික : දැන් අපි මෙතන බිම ඉදගන්න  රාජ්‍ය ආරක්ෂක අමත්‍යංශයට කතා කරන්න ඕන.**

**මුරකරුඃ අපි කරන්නෙ අපිට කියලා තියන වැඩේ. කරුණාකරලා වෙන තැනක් හොයාගන්න.**

## සිදුවීම් අංක 05 (නිදහස් චතුරස්‍රය)

නාට්‍ය කණ්ඩායමේ කිහිප දෙනෙකු සමග නිදහස් චතුරස්‍රය ගොඩනැගිල්ලෙහි බිම ඉඳගෙන ලැප්ටොප් එකක් දිග හැරගෙන සාකච්ඡාවක සිටිති. එම ස්ථානයට පැමිණි මුරකරුවෙක්.

**මුරකරුවා : මේක ඇතුලේ බිම ඉඳගන්න බෑ. ලැප්ටොප් වැඩ කරන්නත් බෑ.**

**කණ්ඩායමේ සාමාජික : ඇයි ඒ**

**මුරකරු : මේක ජාතික උරුමයක්. මෙතන ඉඳගන්න බෑ. ඉඳගන්න ඕන අයට තමයි අර පහල බංකු හදලා තියෙන්නේ.**

**කණ්ඩායමේ සාමාජික : ඒක මහ පුදුම කතාවක් නේ. මේක නිදහස් චතුරස්‍රය. මෙතන නිදහසේ ඉන්න කාගෙන්ද අවසර ගන්න ඕන?**

**මුරකරු : කරුණාකරලා මහත්තයලා නැගිටලා පහලට යන්න. නැත්නම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ගිහින් අවසර අරගෙන එන්න.**

## සිදුවීම් අංක 06 (Urban Wetland Park - Nugegoda)

Urban Wetland Park (නුගේගොඩ) තුළ වු සිමෙන්ති වලින් සාදන ලද බැම්මක් මත ඉඳගෙන නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයෙක් ඔහුගේ මිත්‍රයෙක් සමඟ කතා කරමින් සිටියි. කතාව අතරතුර ඔහු පාවහන් ගලවා දෙපා එම සිමෙන්ති බැම්ම උඩට ගනියි. සුළු මොහොතකින් එම ස්ථානයට පැමිණි රාජකාරි කරමින් සිටින නාවික හමුදා සෙබළෙක් (නිල ඇඳුම සහිතව)

**හමුදා සෙබළා : කකුල් දෙක පාත් කරගන්න.**

**කණ්ඩායමේ සාමාජික : ඇයි?**

**හමුදා සෙබළා : බෝඩ් පෙන්නේ නැද්ද?**

**(අසල ඇති බෝඩ් දෙකක් පෙන්වමින්)**

**"විනීතව හැසිරෙන්න"**

**" බැම් මත කකුල් තැබීම තහනම්"**

## සිදුවීම් අංක 07 (නිදහස් චතුරස්‍රය)

නිදහස් චතුරස්‍ර ගොඩනැගිල්ල තුළ කණ්ඩායමේ සාමාජිකයෙක් ඡායාරූපයක් ගැනීමට සුදානම් වේ. ඒ අසලට පැමිණි මුරකරුවෙක්,

**මුරකරු : මෙතන ෆොටෝ ගන්න බෑ.**

**කණ්ඩායමේ සාමාජික : ඇයි. අර කට්ටියක් ෆොටෝ ගන්නේ (මනමාල යුවලක් අප අසල ෆොටෝ ගනිමින් සිටියි)**

**මුරකරු : එයාලා අවසර අරගෙන තියෙන්නේ.**

**කණ්ඩායමේ සාමාජික : කොහෙන්ද අපි අවසර ගන්න ඕන**

**මුරකරු : රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයෙන්**

## සිදුවීම් අංක 08 (INDEPENDENT ARCADE)

නාට්‍ය පුහුණුවීම් කාලයේ නාට්‍ය කාණ්ඩායමේ සාමාජිකයෙක් ත්‍රිවිලර් රථයකින් තුම්මුල්ල දිශාවෙ සිට බෞද්ධාලෝක මාවත දිගේ බොරැල්ල දිශාවට යන අතරතුර අලුතින් ගොඩනැගුනු නිදහස් වෙළඳ සංකීර්ණය (Independent arcade) පසු කරන විට ඔහු රියදුරු සමඟ සුහද කතාවක් අරබයි.

**කණ්ඩායමේ සාමාජිකයෙක් : ලස්සනට ඉන්න තැන් ටිකක් කොළඹ අවට හැදෙනවා නේද?**

**රියදුරු : ඕවා අපිට යන්න හදන තැන් නෙවෙයි මහත්තයා**

## සිදුවීම් අංක 09 (දියවන්නා වෝකින්ග් පාත්)

කිඹුලාවල හන්දියේ වාහන නවත්වන ස්ථානයේ නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයන් කිහිප දෙනෙක් රාත්‍රී 10.00ට පමණ කතා කරමින් සිටිති. ටික වේලාවකට පසු ජීප් රථයක් පැමිණ ඔවුන් අසල පාරේ නවත්වයි. එම රථය තුළ පුද්ගලයින් තුන්දෙනෙක් පමණ සිටියි. රථයේ සිටි පුද්ගලයෙක් ඔවුන් අමතමින්.

**ඉදිරි අසුනේ සිටි පුද්ගලයා : මොකද කරන්නේ මෙතන?**

**කණ්ඩායමේ සාමාජිකයෙක් : නිකන් ඉන්නවා.**

**ඉදිරි අසුනේ සිටි පුද්ගලයා : නිකන් ඉන්න වෙන තැනක් හොයාගන්න. මේ අධි අරක්ෂිත කලාප. නිකරුනේ ගැවසෙන්න බෑ.**

## සිදුවීම් අංක 10 (නිදහස් චතුරස්‍ර)

නිදහස් චතුරස්‍ර පරිශ්‍රය තුළ තරුණ ගැහැනු ළමුන් හය දෙනෙක් බාස්කට් බෝල් සෙල්ලම් කරමින් සිටිති. මොහොතකින් බොටම් ඇඳගත් පුද්ගලයෙක් ඔවුන් අසලට පැමිණෙයි. ඉන්පසු සෙල්ලම් කරමින් සිටි තරුණියන් තමන්ගේ බෑග් රැගෙන එම ස්ථානයෙන් පිටවෙන්න සුදනම් වේ. එවිට නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයෙක් වහාම එම ස්ථානයට ගොස් ඔවුන් සමඟ කතා කරයි.

**කණ්ඩායමේ සාමාජිකයෙක් : මොකක්ද අර කෙනා කිව්වේ?**

**තරුණියක් : මෙතන තණකොළ උඩ සෙල්ලම් කරන්න බෑ කිවුවා.**

**කණ්ඩායමේ සාමාජිකයෙක් : ඔයාලා ඇහුවේ නැද්ද ඇයි කියලා?**

**තරුණියක් : අපෝ අනවශ්‍ය ප්‍රශ්න දාගන්න ඕන නෑ. අපි යනවා කැම්පස් එකට.**

**කණ්ඩායමේ සාමාජිකයෙක් : ඔයාලා මොන කැම්පස් එකෙද?**

**තරුණියක් :** NIBM

**කණ්ඩායමේ සාමාජිකයෙක් : ඔයාලට මෙතන සෙල්ලම් කරන්න අයිතියක් තියනවා. ඒක කතා කරන්න.**

**තරුණියක් : කතා කරා කියලා තේරුමක් නැ.**

**මෙලෙස කණ්ඩායම සති කිහිපයක් පුරාවට විවිධ අයුරින් ඇවිදින මංතීරු ආශ්‍රිතව පවතින උප සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයෙන් ලබා ගත් කරුණු උපයෝගි කොට ගනිමින් ඇවිදින මංතීරු නොහොත් වෝකින්ග් පාත් පිළිබඳව වචන නැති නාට්‍යය නිර්මාණය කිරීමේ මුලික පුහුණුවීම් ආරම්භ කරන ලදි.**

# 04

## "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" අංක දහ හතකින් සමන්විත රංගයක් බවට පත්වීම



"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" අංක දහ හතකින් සමන්විත වේදිකා නාට්‍ය රංගයකි. මෙම පරිච්ඡේදයේ දී පළමු කොටස වශයෙන් මෙම නාට්‍යයේ චරිත ගොඩනැගීම සහ රංගය වින්‍යාසගත කිරීම පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. දෙවන කොටස වශයෙන් රංගයේ ඩිවයිසන් ක්‍රියාවලිය සහ පුහුණුවීම් ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ.

# චරිත ගොඩනැගීම

**"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" හි චරිත ගොඩනැගීමේදී ප්‍රධාන කණ්ඩායම් තුනක් එකිනෙකට වෙනස් අයුරින් පැහැදිලිව**

### ප්‍රධාන රූපණ වෘන්දය (MAIN ENSEMBLE)

රූපණ ශිල්පීන් පස්දෙනකු සහ රූපණ ශිල්පිනියන් දෙදෙනෙකුගෙන් මෙම ප්‍රධාන රූපණ වෘන්දය සමන්විත වේ. ප්‍රධාන රූපණ වෘන්දය විසින් ඇවිදින මංතීරු වෙතට පැමිණෙන විවිධ මිනිසුන් සංඛේතවත් කරයි.

### හමුදාව (ARMY)

රූපණ ශිල්පීන් හය දෙනෙකුගෙන් සමන්විත මෙම පිරිස මගින් යුද්ධය අවසන් කර පැමිණෙන සොල්දාදුවාගේ සිට ඇවිදින මංතීරු පාලනය සහ නඩත්තු කරන පිරිස දක්වා වූ භූමිකාවන් එම අංකයන්ට අදාළව නිරූපණය කරයි.

### වෝකින්ග් පාත් තුල දුවන පිරිස (RUNNER)

මෙම පිරිස අපට හමුවන්නේ පළමු අංකයේ සහ අවසාන අංකයේ පමණි. මෙම පිරිස නිර්මාණයේ ප්‍රධාන චරිත නිරූපණය නොකරයි. ඔවුන් හරහා සංඛේතවත් කරන්නේ එකම රටාවකට අනුව රටේ සිදුවන කිසිවක් ප්‍රශ්න කිරීමකින් තොරව බාරගන්නා සහ නොනැවතී දුවන සාමාන්‍ය ජනතාවයි.

මෙහි නිශ්චිත ස්ථාවර චරිත නොමැත. සෑම චරිතයක්ම සංඛේතවත් චරිත වේ. අංකයෙන් අංකයට චරිතවල අනන්‍යතාව වෙනස් වේ. රංගයේ ප්‍රධාන ප්‍රස්තුතයට අදාළව චරිත ගොඩනැගීම සිදුකර ඇත.

# රංගවින්‍යාසයගත කිරීම

"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" රංගය වින්‍යාසගත කිරීමේ දී මූලිකව අවධානය යොමු වූ ප්‍රධාන කරුණු දෙකකි. එනම්,

**ඇවිදින මංතීරු භාවිතා කරන මිනිසුන්ගේ හැසිරීම්**

ඇවිදීම සහ දිවීම
ශරීර සුවතා කිරීම
Zumba dance
යෝගා සහ භාවනා
පිරිසිදු කිරීම
බලාසිටීම
මිනිසුන්ගේ සමාජ පංතිය.

මෙම කාරණා මුල් කරගනිමින් චරිතවල ක්‍රියාකාරීත්වය සහ හැසිරීම ගොඩනගන ලදී.

**ඇවිදින මංතීරු තුළ ඇති බෙදා ඇති ආකාරය**

ඇවිදීම සඳහා වෙන් වූ මාවත්
මිනිසුන් ඇවිදින දිශාව සහ පිළිවෙල
ශරීර සුවතා කිරීමට සහ මිනිසුන්ට එකට ගැවසිය හැකි ස්ථාන වෙන් කර තිබීම
මාවත් එකකට එකක් සම්බන්ධ කර තිබීම

යන කරුණු මුල්කර ගනිමින් එක් එක් අංකයට අදාළ ව රූපණ ශිල්පීන් වේදිකාවට අවතීර්ණ වන මොහොතේ සිට පිටවන මොහොත දක්වා රූපණ ශිල්පීන්ට අදාළ ගමන් මාර්ගයක් වෙන් කර තිබුණි. ඒ අනුව වේදිකාවේ ඒප්‍රන් එක හරහා, පළමු, දෙවන, තෙවන සහ සිව්වන පැති තිර හරහා මාවත් ඇති බවට උපකල්පනය කරමින් රංග වින්‍යාසය ගොඩනැගීම සිදු කරන ලදි.

තවද, කොළඹ නගරය වටා ඇති ඇවිදින මංතීරු හමුදාව විසින් ගොඩනැගීම සහ නඩත්තු කිරීම සංකේතවත් කරමින් හමුදාවේ සාමාජිකයින් ලෙස රංගනය ඉදිරිපත් කළ පිරිස විසින් සියලුම පසුතල වෙනස් කෙරේ.


FIRE EXIT

# ඩිවයිසින් ක්‍රියාවලිය

"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්"
නිර්මාණයෙහි ඩිවයිසිං ක්‍රියාවලිය, පුහුණුවීම්
ක්‍රියාවලිය සහ

## අංක දහ හතකින් සමන්විත රංගය

ගොඩනැගුණු ආකාරය.

-

**මෙම නිර්මාණය ඩිවයිසන් ක්‍රියාවලිය පුහුණුවීම ක්‍රියාවලියට සමගාමී ව සිදුවිය. එහි දී පුහුණුවීම් කාලය ආරම්භයේ දී ක්ෂණික නිරූපණයන් මගින් රංගයන් ගොඩනැගීම සිදුවිය. නාට්‍යයේ සාකච්ඡා කරනු ලබන ප්‍රස්තුතයට අදාල නොමැති යැයි හැඟුනු රංගයන් සහ රංග කොටස් ඉවත් කරන ලදි. මෙම පරිච්ඡේදයේ සඳහන් වනුයේ නාට්‍යය සඳහා අවසාන වශයෙන් යොදාගනු ලැබූ රංග කොටස් දහ හත පිළිබඳ ව පමණි.**



SCENE 1

# නරක කාලය අවසන්! නව යුගයක උදාව!

**සංකල්පය**

වසර 30ක යුද අවසානය, නව යුගයක ආරම්භය සනිටුහන් කරමින් රණවිරුවා උත්කර්ෂයට නගා, නිමේෂයකින් බිහි වූ නගර ආශ්‍රිත අලංකාරවත් නව උප සංස්කෘතියක් පුරවැසියන් කුතුහලයකින් තොරව වැලඳ ගනියි.

ඔව්, ඇත්ත වශයෙන්ම, එය නව යුගයක උදාවයි...

**දර්ශනයේ ස්වරූපය**

නාට්‍යය ආරම්භයේදී තිරය විවර වනවාත් සමඟ ප්‍රේක්ෂකයන්ට දක්නට ලැබෙනුයේ වෙඩිතැබීම සඳහා පෝලිම් කරන ලද බියෙන් තැතිගත් මිනිසුන් පිරිසකි. ඊලඟ නිමේෂයේ දී වෙඩි වැදී දගලන මිනිසුන් පිරිසක්වේ. එම හඬ වෙඩි හඬක් , පසු ව රතිඤ්ඤා හඬක් ද පසුව බැලුම් පුපුරන හඬක් බවට ද පත් වේ. බැලුම් අතින් ගත් සහ වතුර තුවක්කු අතින් ගත් පිරිසක් පිරිවරාගෙන සිනහා මුසු මුහුණෙන් ඉදිරියට ඇදෙන හමුදා පිරිසක් වේ.

බියෙන් සිටි මිනිසුන් යුද්ධය අවසානය ජයග්‍රහනයක් ලෙස සැමරීමෙන් අනතුරු ව පසුපස හැරී බලන විට ඔවුන් දකිනුයේ ඇවිදිම සහ යහපත් සෞඛ්‍ය පවත්වා ගැනීම සඳහා ඉදි කර ඇති අලංකාරවත් ස්ථාන වේ.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණ**

පහත සදහන් කරුණු මුල් කරගනිමින් ක්ෂණික නිරූපන ක්‍රියාවලිය ගොඩනැංවිය. නාට්‍යයේ ආකෘතිය, ස්වරූපය ප්‍රේක්ෂකයා වෙත ගෙනයාම මෙම අංකයෙන් අපේක්ෂා කෙරේ. ඒ අනුව

- යුද්ධය අවසන් කර පැමිණෙන හමුදා සෙබළුන් සමඟ සාමන්‍ය මිනිසුන් ගොඩනගන සම්බන්ධය කුමක්ද?
- නොදන්නා අලුත් සංස්කෘතියක් වෙත ඇද දැමූ පිරිසකගේ හැසිරීම කුමක් විය හැකිද?
- ඇවිදින මංතීරුවල නුපුරුදු ආකාරයට දුවන මිනිසුන් සහ ඉතාම පුරුදු ආකාරයට දුවන මිනිසුන්ගේ හැසිරීම් කුමන ආකාරයක් විය හැකිද?



# SCENE 2

# නිදහස් අවකාශ විවෘත සම්බන්ධතා

**සංකල්පය**

නැවුම් නිදහස් අවකාශ මත ඇතිවන, මොහොතින් මොහොත වෙනස් වන, මතුපිටින් දිවෙන අලුත්ම ආකාරයක මිනිස් සම්බන්ධතා බිහිව ඇති, මිනිස් ප්‍රජාවක ආරම්භයක්.

නිදහස මතින් ගොඩනැගෙන අනියම් සම්බන්ධතා තුල ඇති නිදහස

**දර්ශනයේ ස්වරූපය**

අලුතින් ඉදිවූ නැවුම් අවකාශයන්හී තනි තනි පුද්ගලයින් ක්‍රමක්‍රමයෙන් අනෙකා සමග ගොඩනැගීමට සුදානම් වන නැවුම් සම්බන්ධතාවන් හී ආරම්භයක් මෙහිදී දැකිය හැකිය.

කෙටි වේලාවක් සඳහා මෙවැනි ස්ථාන භාවිතා කර ශරිර සුවතා කර පිටවීම මෙයින් නිරූපණය වේ. ශරිර සුවතා තුළ දැකිය හැකි නැවත නැවත එකම දේ  සිදු කිරීමේ ගුණය මෙම රංගයේ බහුලව දැකගත හැක. එම නැවත නැවත කිරීමේ දී ඒ ඒ අවස්ථාවට අදාළ ව හැඟීම වෙනස් වන විට එයින් ගම්‍යවන අර්ථය වෙනස් වන ආකාරයත්, මිනිසුන් ඇස් මගින් පවත්වන සම්බන්-ධතා (EYE CONTACT) වෙනස් කිරීම මගින් සම්බන්ධතා වෙනස් වන ආකාරයත් හඳුනා ගත හැක.

සෑම රූපණ ශිල්පීන් දෙදෙනෙක්ම රංගය තුළ එක් වරක් පමණක් සම්බන්ධයක් ගොඩනගා ගන්නා අතර එකම හැඟීමක් දෙවරක් භාවිතා නොකරයි.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- තව කෙනෙකුගේ ආකර්ෂණය ලබාගැනීම උදෙසා කරන ශරීර සුවතා අභ්‍යාස මොනවාද?
- චලනය සහ නිශ්චල බව අතර සම්බන්ධය මෙන්ම වේගයෙහි (speed) වෙනස හරහා අර්ථ බිහිකරගත හැකිද?
- ශරීර සුවතා තුළ ඇති ඒකාකරී බව මගින් අර්ථ ගොඩනැගිය හැකිද?



# SCENE 3 සිංහ රුවක ඝර්ජනාව

**සංකල්පය**

**ඔබත් මාත් හොඳින්ම දන්නා සිංහල ජාතියේ ප්‍රතිමූර්තිය බඳු වූ සිංහ රුව ක්‍රමක්‍රමයෙන් ගාම්භීර හඬින් සියල්ලන්ටම ඉහලින් තර්ජනාත්මකව දෝංකාර නංවද්දී ඔබගේත්, මාගෙත් හඬට සහ නිදහසට ඇති වටිනාකම්, නිදහස් අවකාශ තුළදීම සීමා විය හැක.**

**"නිදහස්" චතුරස්‍රයට නව අරුතක්.**

**දර්ශනයේ ස්වරූපය**

**නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ තිබෙන සිංහ ප්‍රතිමාව අනුකරණය කරමින් එක් රූපණ ශිල්පියෙක් වේදිකාව මැද සිටියි. එය අසලට පැමිණෙන මිනිසුන් කෙරෙහි සිංහයා මින් පෙර දැක් වූ ප්‍රතිචාරය වෙනස් වී ඇති බව පෙනේ.**
**සිංහ ප්‍රතිමාව ගොරවන්න පටන්ගැනීම, ක්‍රමක්‍රමයෙන් සිංහ නාදය දෝංකාරයක් වීමේ සිට හමුදා අණක් ලබා දෙන විසිල් එකක් නාද විමේ හැකියාව දක්වා වූ මිලිටරීකරණය ආරම්භ විම ක්‍රමානුකූලව වර්ධනය වේ.**
**මෙම නිදහස් අවකාශයන් හී සිදුවිය හැකි භයානක මර්දනකාරී ස්වභාවය ඉස්මතු වීමක් මෙම අංකය අවසාන වන විට දැකගත හැක.**

**වේදිකාවේ ඉදිරියෙන් දකුණු පසට පමණක් ගමන් කළ හැකි බවට විනයගත කරන ආකාරය රංගය මගින් ගොඩනැගීම සිදුවේ.**

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- **සිංහ ප්‍රතිමාව සමඟ සාමාන්‍ය මිනිසුන්ට මුලින් පැවති සම්බන්ධය ?**
- **සිංහ ප්‍රතිමාව ඇල්ලිම තහනම් කිරීමට පසුව ඇති සම්බන්ධය?**



# SCENE 4 අවසාන අංශුව දක්වා

**සංකල්පය**

උත්කර්ශයට නංවන රණවිරුවාගේ විනය පිරිසිදු කරන කම්කරුවාගේ රාජකාරියට මාරු වීමත් සමඟ අවසන් අංශුව දක්වා පිරිසිදු වන නිදහස් අවකාශ.

පිරිසිදුකම මතින් වසන් කරන පාලනයේ කිලුට...

**දර්ශනයේ ස්වරූපය**

මිනිසුන් ඇවිදින මංතීරු වෙත පැමිණීමට පෙර එම ස්ථාන පිරිසිදු කිරීම හමුදාව විසින් සිදු කරයි. ඔවුන් රාජකාරිය වශයෙන් පිරිසිදු කිරීම් විනයානුකූල ව සිදු කරනා ආකාරය මෙහිදී දැකගත හැක.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- හමුදා සෙබලුන් තුවක්කු වෙනුවට පිරිසිදු කරන ආම්පන්න අතැතිව සිටින ආකාරය කෙබඳුද?
- පිරිසිදු කරන විට ඇති ඒකාකාරී බව සහ ඔවුන්ගේ අභිමානය ඔවුන් තුළින්ම ක්‍රමයෙන් හීන වූ විට කුමක් විය හැකිද?



## SCENE 5

# කුරුල්ලන්ගෙන් පරිස්සම් වන්න

**සංකල්පය**

රාජකාරිය දේවකාරියක් වුව ද, තනි වුනු මොහොතක හමුදා සෙබළාට ද මනුෂ්‍යයෙක් ලෙස සිතුවිලි ඉපිදිය හැකි නමුත්, පාලකයන්ට එය කිසිදාකවත් උදා වන්නේ නැත.

මනුෂ්‍යත්වයට ඇති සීමාව....

**දර්ශනයේ ස්වරූපය**

දිවා කාලය පුරාවට ගස් යටට වී තනි ව රාජකාරි කරනු ලබන හමුදා සෙබළෙක් කුරුල්ලෙක් සමඟ සම්බන්ධයක් ගොඩනැගීමට උත්සහ කරයි. තුන්වන පාර්ශවයක් විසින් කුරුල්ලා එලවා දැමීමට කරනු ලබන තර්ජනාත්මක විසිල් හඬක් හමුදා සෙබළා වෙතද එල්ල වේ..

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- හමුදා නිලධාරීන්ට රාජකාරියේ සිටින විට බාහිර සම්බන්ධකම් ගොඩනඟා ගැනීමට හැකියා-වක් තිබේද?



# SCENE 6

# ඒ මම නෙවෙයි

**සංකල්පය**

**ඕනෑම ආකාරයක මිනිස් සම්බන්ධතාවක්, හැසිරීමක් හෝ මිනිස් හැඟීමක් ක්ෂණයක තර්ජනාත්මක විසිල් හඬකින් පාලනය කළ හැකි, නොපෙනෙන පාලන බලයක්.**

**මා වැන්නවුන්ගේ පාලනයේ වගකීම මා සතුය.**

**දර්ශනයේ ස්වරූපය**

**ආදරණීය ව වේදිකාවට ඇතුල්වන කණ්ඩායම් යුගල හතරකි. එම කණ්ඩායම්වලට තෝරාගත් පැහැදිලි මොහොතවල් කිහිපයක දී (අතින් ඇල්ලිම, ළංවිම, සිපගැනිම, වැලඳ ගැනිම, ළඟට වි සිටිම ආදී...) එය නැවැත්වීමට විසිල් කිරීම මගින් අණ කරයි. ඒ හරහා ඔවුන්ගේ සම්බන්ධයට සිදුවන බාධා සහ වෙනස් වීම් දැකගත හැක.**
**හමුදාවේ බලය හමුවේ අසරණ වන පෙම්වතුන් සහ කාලයාගේ ඇවෑමෙන් මෙවැනි ක්‍රියා නිසා කිසිදු හේතු විමසීමකින් තොරව මිනිසුන් විසින්ම ස්වයංව පාලනය වන ආකාරය රංගය මගින් ඉස්මතුවේ.**

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- **ප්‍රසිද්ධ ස්ථානයන්හී ආදරය කරන විට සිදුවන හැසිරීම් මොනවාද?**
- **තනි හමුදා සෙබලෙක් සමඟ අසාධාරණය හමුවේ පෙනිසිටිය හැකි ආකාරය කුමක්ද?**
- **හමුදා සෙබලු කිහිප දෙනෙක් සිටින තැනක අසාධාරණය හමුවේ පෙනිසිටිය හැකි ආකාරය කුමක්ද?**



## SCENE 7

# “ජිං ජිං තාරා” මා පාලනය වන දුරකථන..

### සංකල්පය

මිනිස් සම්බන්ධතාවන්ගේ සමබරතාවය, සීමාව, අනෙකාගේ නිදහස හෝ බාධා කිරීමට ඇති අයිතිය, සියල්ලක්ම අජීවි දුරකතනයක් සජීවී වීම මගින් මොහොතින්  මොහොත වෙනස් වන මිනිස් හැසිරීම්.

මා පාලනය වන දුරකථන...

### දර්ශනයේ ස්වරූපය

මෙම දර්ශනය කොටස් දෙකකින් සමන්විත අතර පළමු කොටස මගින් ZUMBA නර්තනය මෙහෙය-වන තරුණියකගේ දුරකතනය දිගින් දිගටම නාද වීම සහ ඇයව අනුකරණය කරන පිරිස එයට දක්වන ප්‍රතිචාරය දැකගත හැක.

දෙවැන්න වශයෙන් නිදහස් අවකාශයන් හී භාවනා කරන විට ජංගම දුරකථනයෙන් උපදින විවිධ නාදයන් (ringing tone" message tone) වලට මිනිසුන් එකඟවන හෝ එකඟ නොවන අවස්ථා සහ මොහොතින් මොහොත දුරකතනය මගින් මෙන්ම මිනිසුන්ගේ හැසිරීම් තුළින් අනෙකාගේ නිදහසට ඇතිවන බාධාව ඉස්මතු කිරීමක් දැකගත හැක.

### ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු

- Zumba dance සංස්කෘතියේ මිනිසුන්ගේ හැසිරීම් කුමන ආකාරයක් ගනිද?
- භාවනා කරන විට ජංගම දුරකතනය බාධාවක් විය හැකි ක්‍රම?



SCENE 8

# මතකය පැරණි විලාසිතාවකි

**සංකල්පය**

යුද වේදනාවේ ස්මාරක භයානක හෝ අවම වශයෙන් බාධාවක් වීමට ඇති අවකාශය මත, අලංකාරය හෝ පිරිසිදු කිරීම මුවාවෙන් එම ස්මාරක ඉවත් කර, සුදු වර්ණාලේපිත සරළ, දිදුලන ස්මාරක ආදේශ කිරීමක් මගින් පාලනයේ පැවැත්ම පහසු කරයි.

යුද්ධය අවසන් කර අවසන්ය...

**දර්ශනයේ ස්වරූපය**

හුදකලාව තුළ අතීත මතකාවර්ජනයක ගරා වැටුනු ප්‍රතිමාවක් අසළ සිටින හමුදා සෙබළෙකුගෙන් රංගය ආරම්භ වේ. එම මතකයන් හමුවේ ඔහුගේ හුදකලාව රාජකාරියක් ලෙස පවත්වාගෙන යාම සිදුවේ.

හමුදාවේ මතක එවැනිම හමුදා පිරිස් පැමිණ වෙනස් කිරීම සහ ඒ මතක පිරුණු ස්මාරකය වෙනුවට දුවන පුද්ගලයෙකුගේ ප්‍රතිමාවක් ගොඩනැගීම දැකගත හැක.

මතක ඉවත් කිරීම හමුවේ යම්කිසි පාර්ශවයක් පත්වන අසරණකම සහ කිසිවක් කරගත නොහැකි තත්වය මෙහි දී දැකගත හැක.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- තනිව සේවය කරන හමුදා සෙබළෙකුට ගරාවැටුණු පිළිමයක් සමග ඇති සම්බන්ධය කුමක් විය හැකිද?
- අලුතින් ඉදිවන ස්මාරක සහ මිනිසුන් ගැවසෙන ස්ථාන වටා පිරිස් එකතු වී ඡායාරූප ගනිමින් විනෝද වන ආකාරය කෙසේ විය හැකිද?



## SCENE 9

# SELFISH සමාජයක SELFIEයක්...

**සංකල්පය**

**සයිබර් අවකාශයේ දි ආකර්ෂණීය, උද්යෝගජනක, සිනහමුසු, නිරන්තර අලුත් යමක් නිරීක්ෂණය කරන හුස්මේ හඬ ඇසෙන මානයේ සිටියදීත්, දුරස්වන මිනිස් සංස්කෘතියක ඡායාරූපයක්.**

'selfish' **සමාජයක** selfie**යක්...**

**දර්ශනයේ ස්වරූපය**

**දර්ශනය අරම්භයේදී කිසිදු සම්බන්ධයක් නැති යුවලක් දැකගත හැක. තුන්වැන්නෙක් වේදිකාවට ඇතුල් වේ. ඔහු දුරකතනය ගෙන කෙටි පණිවිඩයක් යවයි. නිශ්චල ව සිටි දෙපළ සක්‍රිය වේ. ක්‍රමයෙන් පිරිස වැඩිවේ. ඔවුන්ගේ සියලුම සම්බන්ධය මූලිකව ම දුරකතනය මගින් පමණක් සිදුවේ.**

**ක්‍රමක්‍රමයෙන්** selfie **පින්තූර ගැසීම සහ ඒවා අනෙකා සමඟ බෙදාගැනීම ආරම්භ වේ. එහි ඇති එකිනෙකා අභිබවා යන ස්වරූපය සහ එහි ඇති ඒකාකාරීභාවය දැකගත හැක.**

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- **ජංගම දුරකතනයට ඇබ්බැහි වූ මිනිසුන්ගේ චර්යා කෙබඳුද?**
- Selfie **ගසන විවිධ ආකාර සහ අනෙකාගේ අවධානය ලබාගැනීමට කරනු ලබන ක්‍රියාකාරකම් මොනවාද?**
- **මිනිසුන්ට ප්‍රතිචාර දැක්වීමෙදී දැකිය හැකි ව්‍යාජ ලෙස හිනාවෙන ආකාර මොනවාද ?**



# SCENE 10 නගරයේ ලිංගිකත්වය

**සංකල්පය**

පොදු ස්ථානයන්හී සදාචාරය හා විනීතභාවය පිළිබඳව ඇති නිර්වචන, ලිංගිකත්වය සහ ප්‍රේමය ප්‍රකාශනය කිරීමට ඇති තහනම හමුවේ නිල නොලත් ප්‍රදර්ශනකාමී හැසිරීම් සහ පවතින සීමාවන් අතික්‍රමණය කිරීමට උප සංස්කෘතියේ ඇති අවකාශය සහ අවශ්‍යතාවය.

**දර්ශනයේ ස්වරූපය**

මිනිසුන්ගේ ආකර්ෂණය, ලිංගිකත්වය සහ හැඟීම් උද්දීපනය කළ හැකියැයි පෙන්නුම් කරනු ලබන ශරීර සුවතා රංගය පුරාවටම දැකගත හැක.

මෙවැනි ආකාරයට හැසිරෙන මිනිසුන් දෙස බලා සිටින මිනිසුන්ගේ ක්‍රියාකාරීත්වය මෙන්ම ප්‍රදර්ශන කාමයේ ඇති හාස්‍යමය ස්වභාවය රංගයේ ස්ථාන ගතවී ඇත.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- ලිංගිකත්වය ඉස්මතු වන ආකරයට සිදුකළ හැකි ශරීර සුවතා මොනවාද?
- ශරීර සුවතා අභ්‍යාස දෙකක් එකතු කිරීම තුළින් වෙනත් අර්ථයක් ගොඩනැගිය හැකි අවස්ථා තිබේද?



SCENE 11

# බැටරි ළදරුවන්

**සංකල්පය**

නිදහස සොයා යන තරඟකාරී මිනිසුන්ගෙන් බිහිවන අලුත් පරම්පරාවේ සීමාව.

නූතන විසිරුණු කුටුම්භය.

**දර්ශනයේ ස්වරූපය**

දර්ශනය ආරම්භයේදී ම දැකගත හැකිවනුයේ වේදිකාව හරහා යන රිමෝට් කාර් එකකි. ඉන්පසු ක්‍රමයෙන් කාර් පදින මිනිසුන් දැකගත හැක. ඔවුන් එම කාර් සමඟ ඇති සම්බන්ධය දරුවන් සහ දෙමව්පියන් අතර සම්බන්ධයට සමාන වේ.

වෙන්වී ජීවත්වන යුවලක් තමන්ගේ දරුවා (කාර් එක) මාරු කරගන්නා ආකාරයක් දැකගත හැක. දරුවකුගේ හැසිරීම, දඟලන ස්වභාවය, හිතුවක්කාරකම, අඬන අයුරු ආදීය රිමෝට් කාරයෙන් නිපදවෙන ශබ්දය උපයෝගි කොට ගනිමින් උද්දීපනය කිරීම දැකගත හැක.

වේදිකාවේ පසුපසට වන්නට කාර් තරඟයක් (Car race) පවත්වන පිරිසක් සිටින අතර එහිදී ද කාර් දරුවන් ලෙස සංකේතවත් වෙයි. එහිදී කාර් හුරතල් කිරීම සහ ටොකු ඇනීම ආදිය දැකගත හැක.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- දෙමව්පියන්ගේ තරඟකාරිත්වය දැක්විය හැකි ක්‍රම මොනවාද ?
- වැඩිහිටියන්ගේ සම්බන්ධයේ දුරස් වීම් සහ දරුවන් සමඟ ඇති දුරස් බව පෙන්විය හැකි ආකාර මොනවාද?



**SCENE 12**

# ඒ සියලු ශෝෂාවෙන් පසු...

**සංකල්පය**

**පාලනය කිරීමට කිසිවකුත් නොමැති මොහොතක පාලනය කරන පිරිසක් දෙස බලා සිටින්නට ද කෙනෙකු නොමැති, නිහඬතාවය මත හුදකලා වූ හමුදාවක්.**

**හුදකලා මංතීරු මත රාජකාරි කරන හුදකලා වූ මිනිස් ශරීර...**

**දර්ශනයේ ස්වරූපය**

**මෙහි ඇත්තෙ ඉතාම කෙටි රංග කිහිපයකි. හමුදාව විසින් පසුතලය කිහිප විටක් මාරු කිරීම සිදු කරන අතර එම මාරු කරන මොහොතේ (**black out**) එකකට පසුව ස්ථාන මාරු වීමක් දැකිය හැක.**

**හමුදා සෙබලුන්ගේ ශරීර චලනයන්හී ඇති කළකිරුනු ස්වභාවය සහ ඒකාකාරී බව සමස්ත දර්ශනය පුරාවට පවත්වාගෙන යාම සිදුවේ.**

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- **රාජකාරිය වශයෙන් කිසිදු රාජකාරියක් නොමැතිව තනි ව සිටිමට සිදුවුනොත් මොකද කරන්නේ?**



# SCENE 13 මගේ දුරකථනයේ ලෝකය

### සංකල්පය

තාක්ෂණයක් මතින් පොදු සමූහය සමග සිටින විට බලපවත්වනා ආචාරධර්මයන් අභියෝගයට ලක්කරමින්, අමුතුම වරප්‍රසාදයකට හිමිකම් කියන, තනි තනි ලෝක තුළ රහසිගත ව අසනා ඕනෑම දෙයක් සමඟ ඇවිදින, හෙඩ්ෆෝන් (headphone) සහිතව ප්‍රියමනාප බව ගිලිහුණු මිනිස් මුහුණු අප අසලින්ම නිතර ගැවසෙයි.

බාහිරට පෙනෙන නිහැඬියාව සමග හැසිරෙන අභ්‍යන්තරික ගුප්ත හඬ...

### දර්ශනයේ ස්වරූපය

මිනිසුන් හෙඩ්ෆෝන් (headphones) දමාගෙන තමන්ගේ රුචිකත්වය මත යම්කිසි දෙයක් අසමින් හෝ රාජකාරී යමක් සිදු කරමින් සිටින පුරුදු ජීවන රටාව පවත්වා ගැනීමට දරන උත්සහය මෙහි දැකගත හැක.

ඔවුන් අසන දේ කුමක්ද යන්න ප්‍රේක්ෂකයන්ට ඇසෙන අතර ඔවුන්ගේ හැසිරීම, ක්‍රියාවන් සහ සම්බන්ධතා තුළ ඇති ව්‍යාකූලභාවය ඉස්මතු වීමක් දැකගත හැක.

### ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු

- හෙඩ්ෆෝන් (headphones) මගින් අසනා දේ?
- හෙඩ්ෆෝන් (headphone) දමාගෙන දුවන හෝ ඇවිදින ආකාරය සහ චරිත ලක්ෂණ මොනවාද?



SCENE 14

# ධාවන පථයෙහි අඩි සලකුණු

**සංකල්පය**

සපත්තු දෙකක් තිබූ පමණින් ඇවිදීමට සුදුසුකම් අත් නොවන, සමාජ පංති වෙන්කිරීමට ඉදිවන අදෘශ්‍යමාන බිත්ති හමුවේ, නිහඬ ව ඈත තමාගේ සීමාවේ සිට බලාසිටින සුවහසක් දුගී ජනයා, මධ්‍යම පාන්තික සිහිනය පොදිබඳින මිනිසුන්ගේ දුවන සපත්තුවට නොදැනුවත්වම නැවත නැවතත් පැගෙමින් පසුපසට තල්ලු වේ.

වේගය සහ පංතිය පවත්වා ගැනීමේ තරඟය හමුවේ, මධ්‍යම පංතියේ ඇවිදීමේ උමතුබව...

**දර්ශනයේ ස්වරූපය**

සපත්තු නොමැති පුද්ගලයෙක් ඇවිදින මංතීරු වෙතට ඇතුල් වී සිටින අතර ඔහුට එහි කිසිදු තැනක් ඉඳගැනීමට හෝ භාවිතා කිරීමට පහසු නොවන බව දැකගත හැක.

ඔහු දෙස එම ස්ථානයේ සිටින කිසිවකු අවධානයක් නොදීම තුළින් ඔහුට ලැබෙනා අවධානය සහ නැවත සපත්තු සහිත ව ඔහු පැමිණිය ද ඔහු එම සමාජ කොට්ඨාසයට නොගැලපෙනා බව ඔහුම වටහා ගැනීමෙන් ඇතිවන පීඩනය හමුවේ එම ස්ථානයෙන් ඉවත්වීම නිරූපණය කරනු ලබයි.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- දිවීම සඳහා භාවිතා කරන සපත්තු නොමැතිව ඇවිදින මංතීරු වෙත පැමිණිය හැකිද?
- සපත්තු නොමැති පුද්ගලයෙක් ඇවිදින මංතීරු තුළ සිටිනවා දුටු විට මිනිසුන්ගේ ප්‍රතිචාරය කුමක් විය හැකිද?
- තමන්ට නොගැලපෙන ස්ථානයක් යැයි හඳුනා ගත් ස්ථාන තුළට ඇතුල් වීමෙදී පුද්ගලයන් තුළ ඇතිවිය හැකි තැතිගැන්මේ ස්වභාවය කුමන ආකාරයක් ගනීද ?



# SCENE 15 ' යමක් ' තහනම්

**සංකල්පය**

නිදහස් අවකාශ තුළදී ඕනෑම යමක් තහනම් විය හැකි අවදියක ඕනෑම මොහොතක, ඕනෑම කෙනෙකුට, ඕනෑම දෙයක් විය හැකිය...

තමන්ගේ ප්‍රවේසම සහ සීමාව තමා ම තිරණය කරගැනීම හෝ එකඟ වීම සෞඛ්‍යයට හිතකර වේ.

**දර්ශනයේ ස්වරූපය**

දර්ශනයේ ආරම්භ වන්නේ කිසිවකුත් නොමැති ස්ථානයක කිසිවක් සඳහන් නොවූ බෝඩ් එකක් සමග පුද්ගලයෙක් කරනු ලබන අරගලයක් සහ එහිදී එම පුද්ගලයාගේ අවශ්‍යතාවය, නිදහස, ඔහුගේ සීමාව නොදැනීම, ආවේගය සහ නැවත පවතින ක්‍රමය සමග එකඟ වීම සිදුවීම දැකගත හැක.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- තමන්ට කරන්න බැරි මොනවාද, කරන්න පුලුවන් මොනවාද යන්න නොදන්නාකම නිසා මිනිසුන් පත්වන අපහසුතාවය කුමක් විය හැකිද?



# SCENE 16 සමූහයකව තනිවම

**සංකල්පය**

**සතුට, විනෝදය, නිදහස හෝ නිරෝගිමත් දිවි පැවත්මකට ඉදි වූ ස්ථාන තුළදී ජීවිතයේ ගැඹුරින්ම ඇතිවන තනිකම, දුක හෝ වියවුල පහ කරගැනීමට නිදහස් අවකාශයේ නිහඬ සහයෝගය ද අවසන් වූ පසුව දැනෙන ශූන්‍යත්වයේ හුදකලාව.**

**හිස් වූ සම්බන්දතා මැද හිස් වූ මිනිස් ශරීර සමූහයක්...**

**දර්ශනයේ ස්වරූපය**

**සියල්ලම නැතිවී කිසිවක් කරකියාගත නොහැකිව සිටින මිනිස් හැසිරීම් සමූහය සහ එම පීඩනය හමුවේ කිසිවකුත් සමඟ සම්බන්ධයක් නොමැති තත්වයකින් දර්ශනය ආරම්භ වේ.**

**දුරකතනය හෝ බාහිර කිසිවක් වැදගත් නැතිවී තමන්ගේ පීඩනය තනි ව පිටකර ගැනීමට උත්සහ දරන හුදකලා වූ පිරිසක් දැකගත හැක.**

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- **කිසිදු මිනිස් සම්බන්ධතාවකින් තොර ව තනි ව හුදකලාවේ සිටීමට සිදුවුනොත් කුමක් සිදුවිය හැකිද?**
- **මානසික පීඩනය පිටකර ගැනීම සඳහා මිනිසුන් ඇවිදින මංතිරූ තුළදී මොනවා කරයිද?**



# SCENE 17

# මෝඩ තීරණ ගන්න එපා..

**සංකල්පය**

වෙනස් වීමට හෝ වෙනස් කිරීම තමා තුළ ඇති නිදහස උද්දීපනය වන්නට ඉඩදීම හෝ කිසිවක් නොවූ අයුරින් බලාසිටීමට පුරුදු කරන ලද ස්වරූපය ඕනෑම මොහොතක වෙනස් විය හැක.

එකඟ විය හැකි කාලය අවසන් වූ පසු ජීවිත අවදානමත් සහනයක් වනු ඇත.

**දර්ශනයේ ස්වරූපය**

මිනිසුන් දැඩි පීඩනයක සිටින විට පළමු අංකයේ දුවන මිනිසුන් ලෙස සිටි පිරිස වේදිකාව හරහා දිවීම ආරම්භ කරන අතර එක් පුද්ගලයෙක් විසින් ඔවුන් නැවැත්වීමට උත්සහ කරනු ලබයි.

හමුදා සෙබලුන් විසින් එම පුද්ගලයාට ප්‍රසිද්ධියේ එල්ල කරනු ලබන පහර දීම හමුවේ අනෙකුත් මිනිසුන් ප්‍රතිචාරය සහ එම පහර කෑ පුද්ගලයා වෙත උදව් කිරීමට යන පුද්ගලයන්ට අත්වන ඛේදනීය ඉරණම දැකගත හැක.

පහර කෑ පුද්ගලයා සහ ඔහුට සහයට පැමිණි පුද්ගලයින් බිම පතිතවී ඇත. සියල්ලෝම එම සිරුරු මතින් දුවන අතර  බැලුම් අතින් ගත් හමුදා සෙබලෙක් වේදිකාව මැද ඉදිරිය බලා සිටියි.

**ක්ෂණික නිරූපණ සඳහා අවධානය යොමුකළ කරුණු**

- එක් පුද්ගලයෙක් ප්‍රසිද්ධියේ පවතින ක්‍රමයට එරෙහිව යාමට තිරණය කළහොත් කුමක් විය හැකිද?
- ඔහු වෙනුවෙන් පෙනී සිටින්නන් හට කුමක් විය හැකිද?

මේ ආකාරයට වෝකින්ග් පාත් නොහොත් ඇවිදින මංතීරු පිළිබඳව වචන නැති නාට්‍යයක් සාමූහික එකතුවක් මතින් ගොඩනගන ලදී.



# 05

## “වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්”

## මංගල දර්ශනය සහ වෙනසක්

මෙම පරිච්ඡේදය තුළින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" නිර්මාණය වාරණය හමුවේ සමාජගත කිරීම උදෙසා නිර්මාණ ශිල්පීන් ක්‍රියා කළ ආකාරය සහ නොවැම්බර් මස නැවත දර්ශනයක් කිරීමේ දී සමාජයේ පැවති වාතාවරණය හමුවේ නිර්මාණයේ ඇතැම් අංකයන් වෙනස් කිරීමට නාට්‍ය කණ්ඩායම ක්‍රියාකළ ආකාරය පිළිබඳවයි.

# වාරණය හමුවේ ප්‍රසිද්ධ රැඟුම් පාලක අවසරය ලබා ගැනීම.

මෙම වකවානුව වන විට රජය විසින් රට තුළ වූ සියලුම කලා මාධ්‍යයන් සඳහා වාරණ නියෝග පනවමින් තිබූ අතර "වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යක්" නාට්‍යය සඳහා ප්‍රසිද්ධ රැඟුම් පාලක අවසරය ලබා ගැනිම සම්බන්ධව නාට්‍ය කණ්ඩායම් සාකච්ඡා කරන ලදි. මෙම අභියෝගය ජය ගැනිම සඳහා "වෝකි-න්ග් පාත් - වචන නැති නාට්‍යයක්" පිටපත රචනා කළ රුවන්ති ද චිකේරා විසින් උපක්‍රමයක් භාවිතා කිරීමක් සිදු කරන ලදි. මෙම නිර්මාණය තුළ වචන නොමැති බැවින් වේදිකාව මත සිදුවන සිදුවීම් සහ මිනිස් හැසිරීම් විස්තර කිරීමක් පමණක් පිටපත තුළට ඇතුල් කිරීම සිදු කරන ලදි. එහිදී පිටපත කියවන පුද්ගලයෙක්ට මෙම නිර්මාණය පවතින රජයට හෝ පවතින ක්‍රමය විවේචනය කිරීමක් ලෙස දැකීමට නොහැකි වන අයුරින් පිටපත ගොඩනැගීම සිදු කරන ලදි. එහි ප්‍රතිපලයක් වශයෙන් කිසිදු අපහසුතාවයකින් තොරව ප්‍රසිද්ධ රැඟුම් පාලක අවසරය ලබා ගැනිමට හැකියාව ලැබුණි.

උදාහරණ වශයෙන් පිටපත : තුන්වන අංකය

SCENE 3

# සිංහ රුවක ඝර්ජනා

## සංකල්පය

මෙම ජවනිකාවෙන් සාකච්ඡාවට ලක් කරන්නේ කොළඹ නගරයේ ඇවිදින මංතීරු ආශ්‍රිතව තිබෙන ඓතිහාසික ස්මාරක සහ ප්‍රතිමා කිහිපයක් පිළිබඳවයි. පශ්චාත් යුධ සමයේදී ශ්‍රී ලංකාවේදී මෙම ප්‍රතිමා ආශ්‍රිතව හැසිරිය යුතු ආකාරය ගැන නව නීති රීති රැසක් බිහිවිය. මේ වකවානුවට පෙර ප්‍රතිමා මත හිඳගැනීමට, ඒවා අතපත ගෑමට සහ ඒවා මත නැගී සෙල්ලම් කිරීමට අවසරය හිමි වී තිබුණද, දැන් ඒ හැසිරීම්වලට සීමා පනවා ඇති බවක් දැකගත හැක. එයට දක්වන හේතුව වන්නේ එම හැසිරීම් එම ප්‍රතිමාවලට කරන අගෞරවයක් බවයි. මෙම ජවනිකාවෙන් දැක්වෙන සිංහ රුවෙන් සංකේතවත් වන්නේ රටෙන් බහුතර ජන පිරිසක් නියෝජනය කරන සිංහල ජාතියයි. මේ ජවනිකාවෙන් දැක්වෙන්නේ උද්‍යා-නයේ ගැවසෙන මිනිසුන් ඔවුන්ට හුරු පුරුදු වූ සිංහ ප්‍රතිමාව සමග දක්වන සබඳතාව වෙනස් වී ඇති ආකාරයයි.
උද්‍යානවල ගැවසෙන මිනිස්සුන්ගේ හැසිරීම් පාලනය කිරීමට විසිල් හඬ යොදාගැනීම ඇරඹුණු ආකාරයත් මෙම ජවනිකාවෙන් මුල් වරට ඉදිරිපත් කරයි.

## රංගය

වේදිකාව මත එක නළුවෙකු පමණක් රැඳී සිටියි. ඔහු මුහුණේ වෙනස් නොවන සිනහවක් රඳවාගෙන මොහොතක් තනිවම සිටියි.
කාන්තාවක් වේදිකාවට පිවිසෙයි. ඇය ව්‍යායාම කිරීමෙන් පසුව වෙහෙසට පත්වී සිටින බවක් දිස් වේ. ඇය ප්‍රතිමාව අසලින් හිඳගනී. ඇය විවේකය පිණිස ප්‍රතිමාවට හේත්තු වෙයි. ප්‍රතිමාව ඇයට ගොරවයි. ඇය ව්‍යාකූල සිතින් වහා නැගිට එතැනින් ඉවත් වෙයි.
මිනිසෙක් වේදිකාවට පිවිසෙයි. ඔහු අත් බෑගයක් සහ ලැප්ටොප් පරිගණකයක් ඇත. ඔහු බිම ඉඳගෙන, ලැප්ටොප් පරිගණකය විවෘත කර බෑගය ප්‍රතිමාවෙහි එල්ලයි. එය ගොරවයි. ඔහු මවිතයට පත් වෙයි. ඔහු බෑගය ඉවතට ගෙන ලැප්ටොප් පරිගණකයද හකුළාගන්නා තුරු ප්‍රතිමාවේ ගෙරවිල්ල නොනවතියි. ඔහු පිළිකුලෙන් යුතුව පිටව යයි.
වේදිකාවේ දෙපසින් තරුණියක් සහ මිනිසෙක් පිවිසෙති. ඔවුහු ප්‍රතිමාව දෙපසින් හිඳගනිති. ඇය ප්‍රතිමාවට හේත්තු වන අතර ඔහු සිගරැට්ටුවක් දල්වාගනී. ප්‍රතිමාව ගෙරවීම අරඹයි. තරුණිය අන්ද මන්ද වෙයි. මිනිසාද අන්ද මන්ද වෙයි. මිනිසා සිගරැට්ටුව නිවා දමන තුරුත්, තරුණිය ඉද්ද ගැසුවා සේ කෙළින් ඉඳගන්නා තුරුත් ගෙරවීම නොනවතියි. දෙදෙනාම වේදිකා-වෙන් බැහැර වී යති.
දිවීමේ ව්‍යායාම කළ පුද්ගලයෙක් වේදිකාවට පිවිසෙයි. ඔහුගේ කමිසය දහඩියෙන් පෙඟී ඇත. ඔහු කමිසය ගලවන අතර සිංහයා ගොරවයි. මිනිසා උස් හඬින් සිනහවෙන්නේ හුරුපුරුදු ප්‍රතිමාව කෙරෙහි සෙනෙහසක් නැතිව නොවේ. නමුත් ගෙරවිල්ලේ රුදුරු බව සහ ඝෝෂාව දිගින් දිගටම වැඩි වෙද්දී එහු තම තෙතබරිත කමිසය නැවත ඇඳගෙන ව්‍යාකූල බවින් සහ සිත් තැවුලෙන් යුතුව වේදිකාවෙන් ඉවතට ඇදෙයි.
ගැටවර වියේ පසුවන තරුණයෙක් වේදිකාවට පිවිසෙයි. ඔහු අත රටකජු ගොටුවකි. ඔහු සිංහයා අසල හිඳගෙන එයට ගොරවයි. ඔහු සෙල්ලමින් පසුවෙයි. ඔහු නැවතත් ගොරවයි. අනපේක්ෂිත ලෙස ප්‍රතිමාවද ගොරවයි. තරුණයා විස්මයට සහ ප්‍රීතියට පත්වේ. ගෙරවීමේ ක්‍රීඩාව ඇරඹෙයි. තරුණයා සහ සිංහ රුවත් ගොරවන හඬ තව තවත් වැඩි කරති. තරුණයා සිංහ රුවේ පිට මතට පැන රුදුරු ලෙස ගොරවමින් ඔහු යන මග සිටින සිතින් මවාගත් සතුරන් වෙත රටකජු ඇටවලින් පහර දෙයි. මේ වන විට පහත් හඬින් ගෙරවූ ප්‍රතිමාව කුපිත වී මහ හඬින් ගර්ජනා කිරීම අරඹා ඇත.

මෙය තවදුරටත් සෙල්ලමක් නොවන බව තරුණයාට වැටහෙයි. ඔහු ප්‍රතිමාව සන්සුන් කිරීමට උත්සහ කරයි. ඔහු ප්‍රතිමාව මතින් බැස, ඔහු විසි කළ රටකජු නැවත අහුලාගෙන ඉවතට ඇදෙයි. නමුත් ප්‍රතිමාවේ ගෙරවිල්ල නොනවතියි. අන්ද මන්ද වූ තරුණයා ගිය මග ඔස්සේ ආපසු එයි. ගෙරවීම නවතියි. ඔහු වෙනතකට ඇදෙයි. සිංහයා යළිත් ගොරවයි. සිංහයා සතුටු කිරීමට නම් යා යුතු මගක් ඇති බව තරුණයා වටහා ගනී. ඔහු ඒ මග ඔස්සේ ඒ මේ අත යයි. සිංහයා සන්සුන්ය.
තරුණයාට මෙය විනෝදයට කරුණකි. ඔහු අවසන් පියවර දක්වාම නිවැරදි මග ඔස්සේ පැන පැන ගොස්, මාන්නක්කාර සිංහයා කුලප්පු කිරීමට හිතාමතාම අවසාන පියවරේදී  මාර්ගයෙන් පිටතට පනී.
ඒ මොහොතේම උස් හඬින් විසිල් නලාවක් නාද වෙයි.
තරුණයා හිටි අඩියේම නවතියි. හැරී බලයි. අන්දමන්ද වෙයි. කොහෙන් ආ හඬක්ද ඒ?

# මංගල දර්ශනය සහ වෙනසක් බලාපොරොත්තු වන සමාජයක්

"වෝකින්ග් පාත් - වචන නැති නාට්‍යයක්" මංගල දර්ශනය ජුලි 26 - 27 දෙදින ලයනල් වෙන්ට් රඟහල - කොළඹ 07 පෙන්වන ලදි. එම නිර්මාණය විනාඩි 75 ක් විවේක කාලයක් නොමැතිව ධාවනය විය. වෝකින්ග් පාත් පිළිබඳව වචන නොමැති නාට්‍යයක් ලෙස කරන ලද පූර්ව ප්‍රචාරණයේ ප්‍රතිපලයක් වශයෙන් සිංහල, දමිළ සහ ඉංග්‍රිසි භාෂාව කතා කරනු ලබන පිරිසක් ප්‍රේක්ෂකාගාරය ලෙස එකතු කරගැනීමට හැකියාව ලැබුණි.

නාට්‍ය කණ්ඩායමේ අවශ්‍යතාව සහ ප්‍රේක්ෂක ඉල්ලීම මත නොවැම්බර් මස 21 - 22 නැවත දර්ශනයක් සූදානම් කරන ලදි. එහිදී පුහුණුවීම් අතරතුර නාට්‍ය කණ්ඩායමේ සාමාජිකයින්ගේ යොජනාවක් වුයේ "ඇයි අපිට බැරි මේ පවතින විදිහ වෙනස් කරන්න පුලුවන් කියලා හිතන්න. යම්කිසි බලාපොරොත්තුවන් දෙන්න." එම යෝජනාව ක්‍රියාත්මක කරමින් නාට්‍යයේ අවසානය වෙනස් කිරීමට තීරණය කරන ලදි.

අවසාන අංකයේ පවතින ක්‍රමය වෙනස් කිරීමට යන පුද්ගලයාට හමුදාව විසින් පහර දිම සහ ඔහුට සහයට පැමිණෙන පුද්ගලයාට ජීවිතයෙන් වන්දි ගෙවිමට සිදු වන අතර අනෙකුත් සියලුම දෙනා බිම වැටි ඇති සිරුරු මතින් දිවිම ආරම්භ කරන අතර පහර කෑමට ලක් වූ පුද්ගලයා නැගිට බලපොරොත්තු සහගතව ඉදිරිය බලා සිටියි. ඉන් අනතුරුව ඔහු පසු කරමින් දුවන පිරිසෙන් එක් පුද්ගලයෙකු ඔහු අසළ නැවති ඔහු සමඟ එකතු වීම සිදුවේ. ඒ අතර අතේ බැලුම් රැගත් හමුදා සෙබළකු වේදිකාව මැද හිඳගෙන ඉදිරිය බලා සිටියි. වේදිකාව ක්‍රමයෙන් අඳුරුවේ.

### විශේෂ සිදුවීමක්

වෝකින්ග් පාත් දෙවන දර්ශනය නොවැම්බර් මස 21 - 22 පැවැත්විය. 21වන දින පවතින රජයට එරෙහිව මෛත්‍රීපාල සිරිසේන මහතා පොදු අපේක්ෂක වශයෙන් 2015 ජානාධිපතිවරණය සඳහා නාම යොජනා භාර දෙමින් පවතින ක්‍රමය වෙනස් කළ නොහැකියි යන මතය අභියෝගයට ලක්කරමින් 2015 ජනවාරි 08 වන දින රටේ වෙනසක් අපේක්ෂාවෙන් සිටි බහුතරයකගේ මනාපයෙන් හත්වන විධායක ජනධිපති ධූරයට පත්විය.



***Walking Path cast & crew*** - *THESPO 16 (2014)*

**අවුරුදු 5ට පසු...**

නැවතත් රටේ ජනතාවගේ වැඩි මනාපය මත ශ්‍රී ලංකාවේ වෝකින්ග් පාත් නොහොත් ඇවිදින මංතීරු සංකල්පයේ ප්‍රධානියා වන ගෝඨාභය රාජපක්ෂ අටවන විධායක ජනාධිපතිවරයා වශයෙන් රටේ බහුතර ඡන්දයෙන් තේරී පත්විය.

© ස්ටේජස් තියටර් ගැරන්ටි ලිමිටඩ්, 2020

මෙම අධ්‍යයන ගොනුව ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ 'Artist Research - Archiving and Documentation' නම් ව්‍යාපෘතියේ කොටසක් ලෙස සම්පාදනය වූවකි.

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වසර දහයක් පුරාවට කළ නිෂ්පාදන ක්‍රියාවලීන් විශ්ලේෂණය හරහා කලා භාවිතයේ නියුතු කලා ශිල්පීන් ඔවුන්ගේම නිර්මාණයන් ක්‍රමවත් හා විචාරාත්මක විශ්ලේෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය. මේ දශකය නම් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිම වූ වසරේ සිට එළැඹි දස වසරයි (2009 සිට 2019 දක්වා).

ප්‍රකාශනයට පත්කිරීමේ අටියෙන් මෙවැනි අධ්‍යයන ගොනු දාසයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් නිම විය. කලා ශිල්පීන් විසින් පර්යේෂණකොට රචනා කරන ලද මේ සෑම අධ්‍යයන ගොනුවක්ම මෙම නිෂ්පාදන බිහි වූ සමාජ-දේශපාලනික සන්දර්භ වටපිටාවන් විභාග කරන අතර එම ක්‍රියාවලීන් තුළදී කරනා ලද නිර්මාණාත්මක තීරණ විශ්ලේෂණය කරයි. මේ ප්‍රයත්නයේම අංගයක් ලෙස ඊට සමගාමී වීඩියෝපට මාලාවක්ද නිර්මාණය කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත් www.stages.lk වෙබ් අඩවිය හරහා ඔබට ලබාගත හැක.

## අධ්‍යයන ගොනු

**සංස්කරණය (ලිඛිත):** රුවන්ති ද චිකේරා

**සංස්කරණය (වීඩියෝ):** මලිත් සුලාර

**භාෂා සංස්කරණය:** නිපුනි ශාරදා පතිරගේ (සිං), කිං රත්නම් (දෙ)

**රචනය:** රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, ජයම්පති ගුරුගේ, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, පියුමි විජේසුන්දර, නලින් ලුසේනා

**පිටු සැලසුම්:** මල්ෂානි දෙල්ගහපිටිය, රජිත පවිත්‍ර මධුභාෂ

**සෝදුපත් බැලීම සහ භාෂා සංස්කරණය:** ආශා අබේකෝන්, ගිහාන් ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, යු.ඩී.ආර්.එච්.කේ.ගුණසිංහ, ට්‍රෙසි හොල්සින්ගර්, අරවින්ද ජයසේකර, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, සුදේශ්නා රන්මුතුගල, කිං රත්නම්, තිලකා සුභසිංහ.

**සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ:** ප්‍රසාද් අලුත්වත්ත, ඩේවිඩ් කොටරල්, සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ, වෙනුර නවෝද්, දෙශාන් තෙන්නකෝන්

**සැලසුම් සහය:** කියාස් අහමඩ්, මල්ෂානි දෙල්ගහපිටිය, ජනිත් හර්ශන.

**පර්යේෂණ සහය:** කෞශල්‍යා ආටිගල, නලින් ලුසේනා, රජිත පවිත්‍ර මධුභාෂ, අකලංක ප්‍රභාශ්වර, දිනුෂිකා සෙනෙවිරත්න

**පරිවර්තනය:** හිරණ්‍යදා දේවසිරි (සිං/ඉං), අරුන්දි ජයසේකර (සිං/ඉං), මනුලි ලවන්‍යා (සිං/ඉං), ලිහිණි නිලවීර (සිං/ඉං), ජිනාදනී පරමේශ්වරම් (දෙ), ශාමලා වේදනායගම් (දෙ), පියුමි විජේසුන්දර (ඉං), හිමංසි දෙහිගම (සි)

**කැමරාකරණය:** වෙනුර නවෝද්, කිං රත්නම්, ප්‍රමිල සමරකෝන්, කසුන් උක්වත්ත

**වෙබ් අඩවි නිර්මාණය:** රන්සක ගල්මන්ගොඩ

**කළමනාකරණය:** මල්ෂානි දෙල්ගහපිටිය, මහේෂ් ලක්මාල්

**ස්ටේජස් නාට්‍ය කණ්ඩායම**
**අධ්‍යයන ගොනු**

**DCS දශක හතක ශ්‍රී ලංකාව**
රචනය : රුවන්ති දි චිකේරා, නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS Girls at Checkpoints**
රචනය : පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS ස්වයංකථන**
රචනය : රුවන්ති ද චිකේරා
සහය: පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**DCS රුවන්ඩා - ශ්‍රී ලංකා සහයෝගීත්ව නිර්මාණය**
රචනය : නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ග්‍රීස් යකා**
රචනය: රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**කළුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**
රචනයඃ රුවන්ති දි චිකේරා, නදී කම්මැල්ලවීර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ දේශාන් තෙන්නකෝන්

**Love and Other Objects**
රචනයඃ ජයම්පති ගුරුගේ
සහයඃ නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ වෙනුර නවෝද්

**Ovaryactingæ**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ වෙනුර නවෝද්

**Passing Stage ව්‍යාපෘතිය**
රචනයඃ රුවන්ති ද චිකේරා
සහයඃ කෞෂල්‍යා ආටිගල, රජිත පවිත්‍ර මධුභාෂ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ

**සිරියානු ස්වයංකථන**
රචනයඃ ජයම්පති ගුරුගේ
සහයඃ නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ දේශාන් තෙන්නකෝන්

**The Certificate**
රචනයඃ රුවන්ති ද චිකේරා
සහයඃ අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණඃ සංජය එක්නැළිගොඩ

**Thought Curfew**
රචනය: පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ඩේවිඩ් කොටරල්

**Walking Path - වචන නැති නාට්‍යයක්**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් කලා ශිල්පී පුහුණු වැඩමුළුව**
රචනය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**Stages Junior Ensemble**
රචනය: පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව**
රචනය: ජයම්පති ගුරුගේ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

stages
theatre
group